# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ 2012 සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්

පිටුව


| | | |
|---|---|---|
| 1. | 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත | 1 |
| 2. | 2012 අංක 7 දරන එකතු කල අගය මත බදු (සංශෝධන) පනත | 3 |
| 3. | 2012 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 9 |
| 4. | 2012 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | 21 |
| 5. | 2012 අංක 10 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත | 23 |
| 6. | 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | 24 |
| 7. | 2012 අංක 12 දරන මුදල් පනත | 26 |

# 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 පෙබරවාරි මස 09 වැනි දින]

**1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීම මගින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1අ) (1) වන උපවගන්තිය යටතේ ස්ථාපිත අරමුදලේ යම් සේවා නියුක්තිකයකු සාමාජිකයකු බවට පත්වන අවස්ථාවක කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නියමිත ආකාරයට එම සේවා නියුක්තයාට සහ සේවා යෝජකයාට හඳුනාගැනීමේ අංකයක් ලබා දිය යුතු ය."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය මෙයින් ඇතුළත් කිරීමෙන් :-

"(ඉඉ) අරමුදලේ ප්‍රයෝජනය පිණිස අරමුදල වෙනුවෙන් ලේකම් කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිල දී ගැනීම හෝ අරමුදලට අයත් නැතහොත් අරමුදල විසින් දරනු ලබන යම් ඉඩමක එවැනි ලේකම් කාර්යාලයක් ඉදිකිරීම සඳහා අරමුදලේ යම් මුදල් ප්‍රමාණයක්, නියම කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට අනුව ආයෝජනය කළ හැකි ය සහ;"

(2) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "එම පැවරීමේ දිනට පූර්වයෙන් වූ අවුරුදු හයක කාලයක් නොඉක්මවන පරිදි, එම මුදල්, සහ" යන වචන වෙනුවට "එම මුදල්" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

23අ.(1) (අ) වසර දහයකට නොඅඩු කාලයක් සඳහා අරමුදලට දායක මුදල් ගෙවා ඇති ;

(ආ) දැනට සේවයේ නියුක්තව සිටින ; සහ

(ඇ) ඔහුගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට රුපියල් ලක්ෂ තුනකට නොඅඩු මුදලක් ඇති,

අරමුදලේ සෑම සාමාජිකයකුම-

(i) නිවාස කාර්යය සඳහා ; හෝ

(ii) වෛද්‍ය ප්‍රතිකාරවල කාර්යය සඳහා,

ඔහුගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට ඇති මුදලින් සියයට තිහක් නොඉක්මවන ප්‍රතිශතයක් ආපසු ගැනීමට හිමිකම ඇත්තේ ය ;

එසේ වුව ද, අමාත්‍යවරයා විසින් ජාතික ආර්ථිකයේ යහපත පිණිස, එවැනි පෞද්ගලික ගිණුමකින් ආපසු ගත හැකි උපරිම මුදල් ප්‍රමාණය, කලින් කල, නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව ඔහුගේ ගිණුමේ, ඔහුගේ බැරට ඇති මුදලින් යම් මුදලක් ආපසු ලබා ගන්නා අරමුදලේ සාමාජිකයකුට, එසේ ආපසු ලබා ගැනීමේ දින සිට අවුරුදු දහයක කාල සීමාවක් සම්පූර්ණ වීමෙන් පසු (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව එකී ගිණුමෙන් දෙවන වරට සියයට තිහක ප්‍රතිශතයක් නොඉක්මවන මුදලක් ඉහත කාර්යවලින් යම් කාර්යයක් සඳහා ආපසු ලබාගැනීමට හිමිකමක් ඇත්තේ ය.

(3) සෑම සාමාජිකයකුට ම අරමුදලේ දායකයකු වශයෙන් සිටින කාලය තුළ දී තම පෞද්ගලික ගිණුමෙන් අවස්ථා දෙකක දී පමණක් මුදල් ආපසු ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා -

"නිවාස" යන්නට, ඒ සාමාජිකයා විසින් -

(අ) සාමාජිකයාට අයත් ඉඩමක නිවසක් ඉදිකිරීම ;

(ආ) නිවාසයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිල දී ගැනීම ;

(ඈ) නිවාස දේපළක් මිල දී ගැනීම ;

(ඈ) නිවාස දේපළක් මත ඇති උකසක් බේරුම් කිරීම ; හෝ

(ඉ) අනුමත බැංකුවකින් ලබාගත් නිවාස ණයක ඉතිරි මුදල බේරුම් කිරීම,

ඇතුළත් වේ. සහ

“වෛද්‍ය ප්‍රතිකාර” යන්නට -

(අ) හෘදය සැත්කම ;

(ආ) බයිපාස් සැත්කම ;

(ඇ) සැත්කම් ඇතුළුව පිළිකා සඳහා ප්‍රතිකාර ;

(ඈ) වකුගඩු බද්ධ කිරීම හෝ සැත්කම් ;

(ඉ) සිසේරියන් සැත්කම ; හෝ

(ඊ) අනතුරක් සිදුවීම හේතු කොටගෙන දින දාහතරකට නොඅඩු කාලයක් රෝහල් ගතව සිටීම,

ඇතුළත් වේ.

(5) මේ වගන්තියේ සඳහන් වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා අරමුදලේ සාමාජිකයාට ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයාට සහ ඔහුගේ හෝ ඇයගේ දරුවන්ට හිමිකම් ඇත්තේ ය.

(6) (1) වන උපවගන්තියේ (i) වන හෝ (ii) වන අනුඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු එකිනෙකට වෙනස් දින අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන යම් නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.”

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තියේ, “සියයට එකක අනුපාතිකයට” යන වචන වෙනුවට “සියයට දෙකක අනුපාතිකයට” යන වචන ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 31අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 31ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

31ආ. (1) අවම වශයෙන් සේවා නියුක්තයන් පනහක් ඔහුගේ සේවයේ නියුක්තව සිටින සෑම සේවා යෝජකයකු විසින් ම එම මාසයට පසුව එළඹෙන මාසයේ අවසානයට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවට පිටපතක් සහිතව නියම කරනු ලබන විස්තර ඇතුළත් මාසික වාර්තාවක් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය”.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති සෑම වාර වාර්ථාවක් ම 2012 ජූලි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි විද්‍යුත් මාධ්‍ය මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ “රුපියල් දහසක් නො ඉක්මවන දඩයකට”, සහ “එක් එක් දිනය සඳහා රුපියල් පනහක් නො ඉක්මවන දඩයකට” යන වචන වෙනුවට අනුපිළිවෙලින් “රුපියල් දෙදහස් පන්සියයක් නො ඉක්මවන දඩයකට”, සහ “එක් එක් දිනය සඳහා රුපියල් හැත්තෑ පහක් නො ඉක්මවන දඩයක ට” යන වචන ආදේශ කිරීමෙන් එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

“(ගග) නිවාස ප්‍රතිලාභ සහ වෛද්‍ය ප්‍රතිකාරවලට අදාළ ප්‍රතිලාභ ප්‍රදානය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ;”.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2012 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2012 අංක 07 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අදාළ වගන්තිවල ක්‍රියාත්මක වීමේ දින නිශ්චිතව දක්වා ඇත්නම් මිස, 2012 ජනවාරි මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ :-

(අ) (ඉ) අනුඡේදයේ (i) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(i) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (i) වන අනුඡේදයේ දක්වා ඇති, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක නියැලි තැනැත්තකු හෝ (2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (ii) වන අනුඡේදයේ දක්වන ලද යම් විශේෂිත ව්‍යාපෘතියක නියැලී සිටින ලියාපදිංචි තැනැත්තකු වෙත කරන ලද සැපයුම් සම්බන්ධයෙන්;"

(2) එහි (iv) වන අයිතමයට ඉක්බිතිව පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

"(v) ඉහත (i), (ii), (iii) හෝ (iv) යන අයිතමවල දක්වා ඇති යම් ලියාපදිංචි තැනැත්තකු වෙත 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු භාණ්ඩ හෝ සේවා සපයනු ලබන යම් ලියාපදිංචි තැනැත්තකු වෙත කරන ලද සැපයුම් සම්බන්ධයෙන්, එසේ වුව ද, එම සැපයුම්වල වටිනාකම එම භාණ්ඩ හෝ සේවා සපයනු ලබන ලියාපදිංචි තැනැත්තාගේ මුළු සැපයුම්වලින් සියයට පනහක ප්‍රතිශතයක් ඉක්මවනු ලබන බවට, කොමසාරිස් - ජනරාල්වරයා විසින්, පවතින තොරතුරු මත සෑහීමට පත් වන්නේ නම් එසේ කරන ලද සැපයුම් සම්බන්ධයෙන්.";

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ දෙවන අතුරුවිධානයේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(ඈ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16ඇ සහ 17අ වගන්ති යටතේ බද්දෙන් නිදහස් කිරීමක් සඳහා සුදුසුකම් ලබන යම් ව්‍යවසායයක් විසින් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇතුළත් වූ යම් ගිවිසුමක නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා ප්‍රයෝජනයට ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළ දී, ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි ඉටු කිරීමට යටත්ව, පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඇ) ඡේදයේ (xxxiv) වන අයිතමයේ දක්වා ඇති පිරියත, යන්ත්‍ර සූත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමේ දී එම භාණ්ඩ සඳහා.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ පළමුවන අතුරුවිධානය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"එසේ වුව ද,

(අ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අපනයනය කිරීම සඳහා යම් ඇඟලුම් නිෂ්පාදකයකු සමග එළඹ ඇති යම් ගිවිසුමක් යටතේ ඉහත කී පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වශයෙන් විකිණීම සඳහා; හෝ

(ii) රේගු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ අපනයනය කිරීම සඳහා ඇඟලුම් නිෂ්පාදනය කරනු ලබන වෙනත් යම් ඇඟලුම් නිෂ්පාදකයකු සඳහා ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වශයෙන් විකිණීම සඳහා,

අවසර දී ඇති ඇඟලුම් ප්‍රතිශතය ඇතුළත යම් ඇඟලුම් සැපයීම මත අයවිය යුතු බදු මුදල ශ්‍රී ලංකාව ඇතුළත සපයනු ලබන එවැනි එක් එක් ඇඟලුමක් සඳහා රුපියල් විසි පහක් විය යුතු ය.

(ආ) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අපනයනය කිරීම සඳහා යම් රෙදිපිළි නිෂ්පාදකයකු සමග එළඹ ඇති යම් ගිවිසුමක් යටතේ ඉහත කී පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වශයෙන් විකිණීම සඳහා; හෝ

(ii) රේගු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ අපනයනය කිරීම සඳහා රෙදිපිළි නිෂ්පාදනය කරනු ලබන වෙනත් යම් රෙදිපිළි නිෂ්පාදකයකු සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය වශයෙන් විකිණීම සඳහා,

අවසර දී ඇති රෙදිපිළි ප්‍රතිශතය ඇතුළත යම් රෙදිපිළි සැපයීම මත අයවිය යුතු බදු මුදල ශ්‍රී ලංකාව ඇතුළත සපයනු ලබන එවැනි කිලෝ එකක රෙදිපිළි ප්‍රමාණයක් සඳහා රුපියල් හතළිහක් විය යුතු ය.";

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ දෙවන අතුරුවිධානයේ "එවැනි ඇඟලුම් හෝ රෙදිපිළි විකිණීමක් මත ආනයනයේ දී ගෙවිය යුතු (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ යම් තීරු බද්දක් හෝ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සෙස් බද්දක් ද ඇතුළුව වෙනත් කිසි බද්දක් හෝ ගාස්තුවක් අය කිරීම හෝ එකතු කිරීම කරනු නොලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "එවැනි ඇඟලුම් හෝ රෙදි විකිණීමක් මත, රට තුළට ප්‍රවේශ වන ස්ථානයේ දී ගෙවිය යුතු (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ යම් තීරු බද්දක් හෝ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සෙස් බද්දක් ද ඇතුළුව වෙනත් යම් බද්දක් හෝ ගාස්තුවක් අයකිරීම හෝ එකතු කිරීම කරනු නොලැබිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්." ;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ දෙවන අතුරුවිධානයේ (ඉ) ඡේදයේ "යෙදවුම් බද්දේ අතිරික්තය" යන වචනවල සිට "මුළු සැපයුම්වලින් සියයට පනහකට වැඩි වූ අවස්ථාවක" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"යෙදවුම් බද්දේ අතිරික්තය,

(ඉ) 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපවත්වන පරිදි (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ කොමසාරිස් - ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන විලම්බනය කිරීමේ යෝජනා ක්‍රමය යටතට පසුව ගෙන එනු ලැබූ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අපනයනකරුවකුට භාණ්ඩ හෝ සේවා සපයන සැපයුම්කරුවකු වන රෙදිපිළි පංගු මණ්ඩලයේ ලියාපදිංචි යම් ලියාපදිංචි තැනැත්තකුගේ හෝ භාණ්ඩ අපනයකරුවන්ට භාණ්ඩ සැපයුම්කරුවකු වන්නා අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචිව සිටින යම් ලියාපදිංචි තැනැත්තකුගේ යෙදවුම් බද්දෙන්, 2 වන වගන්තිය යටතේ විලම්බනය කරන ලද බදු ඇතුළුව යෙදවුම් බද්දේ අතිරික්තයක් පවත්නා අවස්ථාවක හෝ බදු අයකළ හැකි කාලසීමාව සඳහා (ඇ) ඡේදයේ, (ඈ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ ඒ හා සම්බන්ධ විධිවිධානවල සඳහන් සැපයුම්කරුවන්ට කරන සැපයුම්වල වටිනාකම, ඒ බදු අයකල හැකි කාලසීමාව තුළ ඔහුගේ බදු අයකළ හැකි මුළු සැපයුම්වලින් සියයට පනහකට වැඩි වූ අවස්ථාවක.";

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ තුන්වන අතුරු විධානයේ "එසේම තවදුරටත්," යන වචනවල සිට "ඉදිරියට ගෙන යා යුතුය." දක්වා සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස අදේශ කරන්න :—

"2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (v) වන අයිතමයේ සඳහන් ලියාපදිංචි තැනැත්තකු වෙත භාණ්ඩ සපයනු ලබන තැනැත්තකු හැර පිරිසැකසුම් නොකර නැවත විකිණීම සඳහා භාණ්ඩ ආනයනය කරන්නා වූ ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන්:

එසේම තවදුරටත්, 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ගෙවන ලද බද්ද නියෝජනය කරමින් අතිරික්ත යෙදවුම් බද්ද, පිරිසැකසුම් නොකර නැවත විකිණීම සඳහා භාණ්ඩ ආනයනය කරන්නා වූ ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් ආපසු නොගෙවිය යුතු නමුත් නිශ්චිත කාලසීමාව සඳහා විලම්බනය කිරීම අදාළ කර ගැනීමේ කාර්ය සඳහා පළකරනු ලැබූ මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති සීමාකිරීම් හා කොන්දේසිවලට යටත්ව, මේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ (i), (ii), (iii) හෝ (iv) අයිතමවල සඳහන් යම් ලියාපදිංචි තැනැත්තකු වෙත භාණ්ඩ සපයනු ලබන අවස්ථාවක දී හැර 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ 2002 ජූලි මස 31 වන දිනට පැවති යම් අතිරික්ත යෙදවුම් බද්දක් ඇතුළු එවැනි යම් යෙදවුම් බද්දක් ඉදිරියට ගෙන යා යුතු ය. " ;

(5) ඒ වගන්තියේ (10) වන උපවගන්තියේ :—

(i) (අ) ඡේදයේ "2010 දෙසැම්බර් මස 31 වන දිනට අන්තර්ග්‍රහණය නොකළ යම් ශේෂයක් ඇත්නම්, එම ශේෂය ඉදිරියට රගෙන යා යුතු මෙන්ම යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා එක් එක් මාසය සඳහා අන්තර්ග්‍රහණය නොකළ ප්‍රමාණයෙන් සියයට දහයකට සමාන ප්‍රමාණයක් ලියාපදිංචි වී ඇති තැනැත්තෙකු විසින් ඉල්ලා සිටිය හැකි නමුත් එම මුදල් ප්‍රමාණය, නිමැවුම් බද්දෙන් ඉඩ දිය හැකි යෙදවුම් බදු බැර අඩු කිරීමෙන් පසු එම තැනැත්තා විසින් ගෙවිය යුතු ශුද්ධ බද්දෙන් සියයට පහක ප්‍රමාණය නොඉක්මවිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කරනු ලැබේ:-

"2010 දෙසැම්බර් මස 31 වන දිනට අන්තර්ග්‍රහණය නොකළ යම් ශේෂයක් ඇත්නම්, එම ශේෂය ඉදිරියට රැගෙන යා යුතු මෙන්ම යම් ලියාපදිංචි තැනැත්තෙකු විසින් :—

(අ) 2011 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන නමුත් 2012 ජනවාරි මස 1 වන දිනට පෙර වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා එක් එක් මාසය සඳහා අන්තර්ග්‍රහණය නොකළ ප්‍රමාණ යෙන් සියයට දහයකට සමාන ප්‍රමාණයක් වන නමුත් නිමැවුම් බද්දෙන් ඉඩදිය හැකි යෙදවුම් බදු බැර අඩු කිරීමෙන් පසු එම තැනැත්තා විසින් ගෙවිය යුතු ශුද්ධ බද්දෙන් සියයට පහක ප්‍රමාණය නොඉක්මවනු ලබන මුදල් ප්‍රමාණයක්;

(ආ) 2012 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා එක් එක් මාසය සඳහා අන්තර්ග්‍රහණය නොකළ ප්‍රමාණයෙන් සියයට දහයකට සමාන ප්‍රමාණයක් වන නමුත් නිමැවුම් බද්දෙන් ඉඩදිය හැකි යෙදවුම් බදු බැර අඩු කිරීමෙන් පසු එම තැනැත්තා විසින් ගෙවිය යුතු ශුද්ධ බද්ද නොඉක්මවනු ලබන මුදල් ප්‍රමාණයක්,

ඉල්ලා සිටිය හැකි ය.";

(ii) ඒ උපවගන්තියේ පළමුවන අතුරුවිධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරුවිධානය ආදේශ කරනු ලැබේ :—

"එසේ වුව ද,

(අ) 2010 දෙසැම්බර් මස 31 වන දිනට අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැරක් ඇති නමුත්, 2011 ජනවාරි මස 1 වන දින සිට සහ ඉන්පසුව මේ පනතේ විධිවිධාන යටතේ බද්දට යටත් විය යුතු බදු අයකළ හැකි සැපයුම් නොමැති; හෝ

(ආ) 2012 ජනවාරි මස 1 වන දින සිට බලපවත්වන පරිදි එක් එක් මාසය සඳහා සත්‍ය වශයෙන් හිලව් කළ යුතු අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැර 10 වන උපවගන්තියේ (අ) ඡේදයේ (ආ) වන අනුඡේදයේ සඳහන් කර ඇති 2010 දෙසැම්බර් මස 31 වන දිනට එම තැනැත්තාගේ අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැරෙන් සියයට දහයක් නොඉක්මවනු ලබන,

යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් අන්තර්ග්‍රහණය නොකල යෙදවුම් බදු බැර සොයා ගැනීමෙන් පසුව පහත දැක්වෙන පරිදි හිලව් කළ හැකි යː-

(i) අවස්ථාවෝචිත පරිදි, පහත දැක්වෙන (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේදවල විධිවිධාන සලසා ඇති ආකාරයට 2011 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන නමුත් 2012 ජනවාරි මස 1 වන දිනට පෙර යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා හිලව් කළ යුතු අතර-

(අ) ලියාපදිංචි තැනැත්තා, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලත් විදුලි සංදේශ සේවාවක ක්‍රියාකරුවකු වන අවස්ථාවක, එම හිලව් කිරීම, 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බද්ද වශයෙන් ඔහු විසින් ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කළ හැකි ය;

(ආ) ආදායම් බදු ගෙවීමට යටත් වන ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන අවස්ථාවක, එම හිලව් කිරීම, ඔහු විසින් 2011 ජනවාරි මස 1 වන දිනයට පසුව 2006 අංක10 දරන දේශීය ආදායම් බදු පනත යටතේ බදු වශයෙන් ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කළ හැකිය;

(ඇ) ඉහත (අ) හෝ (ආ) ඡේදවල විධිවිධාන අදාළ නොවන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම හිලව් කිරීම, කොමසාරිස් - ජනරාල්වරයා විසින් පාලනය කරනු ලබන සහ තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ බදු වශයෙන් එම තැනැත්තා විසින් 2011 ජනවාරි මස 1 වන දිනයට පසුව ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කළ යුතු ය;

(ඈ) ඉහත (අ), (ආ) හෝ (ඇ) ඡේදවල විධිවිධාන අදාළ නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම හිලව් කිරීම, රේගු අධ්‍යක්ෂ -ජනරාල්වරයා විසින් ඒ හා සම්බන්ධ කරුණු සලකා බැලීමෙන් පසුව කොමසාරිස් - ජනරාල්වරයාගේ අනුමතය ඇතිව, එම තැනැත්තා රට තුළට ප්‍රවේශ වන ස්ථානයේ දී බදු වශයෙන් 2011 ජුලි මස 13 වන දිනයට පසුව ගෙවිය යුතු මුදලට එරෙහිව සිදුකිරීම සඳහා සලකනු ලැබිය හැකි ය.

(ii) අවස්ථාවෝචිත පරිදි, පහත දැක්වෙන (අ), (ආ) හෝ (ඇ) ඡේදවල විධිවිධාන සලසා ඇති ආකාරයට, 2012 ජනවාරි මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා හිලව් කළ යුතු අතර-

(අ) ලියාපදිංචි තැනැත්තා, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලත් විදුලි සංදේශ සේවාවක ක්‍රියාකරුවකු වන අවස්ථාවක, එම හිලව් කිරීම, 2011 අංක 21 දරන

විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බද්ද වශයෙන් ඔහු විසින් ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කළ හැකි ය; හෝ

(ආ) දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් බද්දක් ගෙවීමට යටත්වන ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන අවස්ථාවක, එම හිලව් කිරීම, කොමසාරිස්-ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ බදු වශයෙන් එම තැනැත්තා විසින් 2012 ජනවාරි මස 1 වන දිනයට පසුව ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කළ හැකි ය; සහ

(ඇ) ඉහත (අ) හා (ආ) ඡේදවල විධිවිධාන අදාළ නොවන යම් ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම හිලව් කිරීම, රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ හා සම්බන්ධ කරුණු සලකා බැලීමෙන් පසුව කොමසාරිස්-ජනරාල්වරයාගේ අනුමතය ඇතිව, එම තැනැත්තා රට තුළට ප්‍රවේශ වන ස්ථානයේදී බදු වශයෙන් 2012 ජනවාරි මස 1 වන දිනයට පසුව ගෙවිය යුතු මුදලට එරෙහිව සිදු කිරීම සඳහා සලකනු ලැබිය හැකි ය.

මේ උපවගන්තිය ප්‍රකාරව, එක් එක් මාසය සඳහා ගෙවිය යුතු බද්දට එරෙහිව වන සම්පූර්ණ හිලව් කිරීම-

(i) එම හිලව් කිරීම, 2011 ජනවාරි මස 01 වන දින සිට නමුත් 2012 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් බදු අයකල හැකි කාලසීමාවක් සඳහා වූ විට, 2010 දෙසැම්බර් මස 31 වන දිනට පවතින අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැර මුදලින් සියයට දහයක් හෝ අදාළ බදු බැදියාවෙන් සියයට පහක් යන ඒවායින් අඩු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය;

(ii) එම හිලව් කිරීම, 2011 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුවන යම් බදු අයකල හැකි කාලසීමාවක් සඳහා වන විට, 2010 දෙසැම්බර් මස 31 වන දිනට අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැර මුදලින් සියයට දහයක් හෝ 2010 දෙසැම්බර් මස 31 වන දිනට පවතින අන්තර්ග්‍රහණය නොකළ මුළු ශේෂයෙන් මාස 12ක කාලය ඇතුළත ගෙවිය යුතු බදු මුදල හිලව් කිරීමෙන් පසු 2011 දෙසැම්බර් මස 31 වන දිනට පවතින ශුද්ධ අන්තර්ග්‍රහණය නොකළ ශේෂය යන දෙකෙන් වඩා අඩු ප්‍රමාණය නොඉක්මවිය යුතුය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තියේ (iv) වන ඡේදයේ "තැනැත්තකු;" යන වචන වෙනුවට

"තැනැත්තකු:

එසේ වුව ද, ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් විසින් මූල්‍ය සේවා සැපයීම මේ වගන්තියේ කාර්යය සඳහා මූල්‍ය සේවාවක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එම කොටසේ (අ) ඡේදයේ:-

(i) (x) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(x) කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර, උදලු, මුල්ලු (2004.07.01 වන දින සිට බලාත්මක වන පරිදි) පොහොර, රේගු කාර්ය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ දක්වා ඇති ආටිමියා බිත්තර සහ පීට් පාසි";

(ii) (xii) වන අයිතමයේ "2010 දෙසැම්බර් මස 31 වන දිනට වඩා පසු නොවී ආනයනය කරන, ඉදිකිරීම් කර්මාන්තය සඳහා ප්‍රයෝජනයට ගන්නා යන්ත්‍ර සූත්‍ර" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඉදිකිරීම් කර්මාන්තය සඳහා ප්‍රයෝජනයට ගන්නා යන්ත්‍රසූත්‍ර," යන වචන ආදේශ කිරීමෙන්;

(iii) (xxi) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

"(xxii) රේගු කාර්ය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ නිශ්චිතව දක්වා ඇති-

(i) ලොරි, ට්‍රක් රථ, බස් රථ, ක්‍රීඩා උපකරණ, රබර් හෝ ප්ලාස්ටික් නිපැයුම් නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රයෝජනයට ගන්නා යන්ත්‍ර සූත්‍ර, අව් කණ්ණාඩි, සුවඳ විලවුන්, අච්චු (වානේ, වීදුරු, රබර් හෝ ප්ලාස්ටික්), ආලෝක සංවේදී අර්ධ සන්නායක උපකරණ;

(ii) ඇස් කණ්ණාඩි සහ ඇස් කණ්නාඩි රාමු නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය;

(iii) කුකුළු කර්මාන්තය සඳහා අවශ්‍ය අයිතම සහ උපාංග;

(iv) දැව (ඉරන ලද) ;

(v) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, ආනයන කිරීම මත, රට තුළට ප්‍රවේශවන ස්ථානයේ දී ගෙවිය යුතු වන

වෙනත් යම් බද්දක් අයකිරීම වෙනුවට විශේෂ අනුප්‍රමාණයන් මත වූ සෙස් බද්දකට යටත්, දේශීය පරිභෝජනය සඳහා වන රෙදිපිළි;

(xxiii) යම් අන්තර්ජාතික කටයුත්තක් ශ්‍රී ලංකාව තුළ පැවැත්වීමෙන් රටට අත්වන ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද එවැනි යම් අන්තර්ජාතික කටයුත්තක් සඳහා වන භාණ්ඩ.";

(2) එම කොටසේ (ආ) ඡේදයේ :-

(i) (අ) අනුඡේදයේ (ii) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ii) ලොරි, ට්‍රැක්ටර් හෝ 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ගෙවීමට නියමිත යම් වාරිකයක් සම්බන්ධයෙන් මගීන් විසිඅට දෙනකුට නොඅඩු ආසන ගණනකින් යුත් යම් මෝටර් කෝච් රථයක් සඳහා.";

(ii) (xiii) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(xiii) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනතේ 2 වන වගන්තියේ (10) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ දක්වා ඇති ජාතිය ගොඩනැඟීමේ බද්ද ගෙවිය යුතු ය යන කොන්දේසියට යටත්ව, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ අයබද්දට යටත්, ආනයනය කරන ලද, පිරිසැකසුම් නොකළ දැව කඳන් හෝ නැව් හෝ වෙනත් භාණ්ඩයක්.";

(iii) (xxxv) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"(xxxvi) මේ කාර්යය සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශ මාලාවේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි ප්‍රකාරව, දේශීය වශයෙන් එකතු කරන ලද භාණ්ඩ විය යුතු, නිෂ්පාදකයා විසින් දේශීයව නිෂ්පාදනය කරන ලදඃ-

(i) ජල විදුලිබල උත්පාදක හෝ සුලං බල උත්පාදක යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ;

(ii) ටර්බයින් යන්ත්‍ර;

(iii) ටින් මාළු හෝ දේශියව නිෂ්පාදනය කරන ලද අමුද්‍රව්‍ය භාවිතා කරන මැටියෙන් තැනූ නිෂ්පාදන;

(iv) සංචාරක හෝටල් හෝ ගුවන් සේවා සඳහා අවශ්‍ය පිරිවිතර අනුව දේශියව සපයා ගන්නා ලද අමුද්‍රව්‍ය භාවිතා කර නිපදවන නිෂ්පාදන;

(v) හඳුනාගත් රාජ්‍ය ආයතන සඳහා, ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවට ආදේශන වන නිශ්චිතව දක්වන ලද නිෂ්පාදන;";

(xxxvii) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ එළඹුණු යම් ගිවිසුමක් යටතේ යම් සහනයක් භුක්ති නොවිඳින යම් නිෂ්පාදකයකු විසින් දේශීය වෙළඳපොළෙහි දේශීයව නිෂ්පාදනය කරන ලද රෙදිපිළි;

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, ආනයනය කිරීම මත, රට තුළට ප්‍රවේශ වන ස්ථානයේ දී රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අය කරනු ලැබිය හැකි වෙනත් යම් බද්දක් වෙනුවට, රේගු කාර්ය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කොට ඇති විශේෂ අනුප්‍රමාණයක් මත වූ සෙස් බද්දකට යටත් රෙදි;

(xxxviii) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 25 වන වගන්තිය යටතේ අඩු කිරීමේ කාර්ය සඳහා, ඒ පනතේ අර්ථානුකූලව, අදාළ සැපයුම්කරු විසින් සපයන පර්යේෂණ සහ සංවර්ධන සේවා වන්නා වූ සේවා;

(xxxix) චිත්‍ර ශිල්පියකු විසින් තම සිතුවම විකුණන අවස්ථාවේ දී, ඒ සිතුවම;

(xL) වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2012 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හෝ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2012 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, අපනයනකරුවන් වෙත හෝ මේ පනතේ බදු කාර්ය සඳහා ශූන්‍ය අනුප්‍රමාණගත සේවා සපයන්නන් වෙත සපයනු ලබන සේවා;

(xLi) 2009 ඔක්තෝබර් මස 8 වන දින සිට බලාත්මක වන පරිදි, අපනයන සංවර්ධන ප්‍රතිදාන වශයෙන් අපනයන සංවර්ධන අරමුදලෙන් ගෙවන ලද යම් මුදලක්;

(xLii) යම් අන්තර්ජාතික කටයුත්තක් ශ්‍රී ලංකාව තුළ පැවැත්වීමෙන් රටට අත්වන ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද එවැනි අන්තර්ජාතික කටයුත්තක් සඳහා සපයන විශේෂිත සේවා;

(xLiii) 2012 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, යම් රෙදිපිළිවල හෝ ඇඟලුම්වල ගුණාත්මක බව, ස්වරූපය හෝ වටිනාකම ඉහළ නැංවීමට ඉවහල් වන සේවා;

(xLiv) 2012 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, දේශීය වශයෙන් නිෂ්පාදිත පාම් ඔයිල්.";

(3) එම කොටසේ (ඇ) ඡේදයේ :-

(අ) (xxiii) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(xxiii) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ විධිවිධාන යටතේ එහි නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගන්නා ලද ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ සපයන ලද භාණ්ඩ හෝ මුදල් අමාත්‍යවරයාගේ අනුමතය සහිතව, (ඊ) ඡේදයේ සඳහන් කරන ලද යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා සපයන ලද භාණ්ඩ.";

(ආ) (xxviii) වන අයිතමයේ, "පත්තු කරන ලාම්පු සහ වක්‍රාකාර ලාම්පු" යන වචන වෙනුවට "පත්තු කරන ලාම්පු, වක්‍රාකාර ලාම්පු, ශබ්ද විකාශන යන්ත්‍ර, ඇම්ප්ලිෆයර්, ශ්‍රව්‍ය සංඛ්‍යාත විද්‍යුත් වර්ධක සහ උපාංග, සිනමා මාධ්‍ය උපකරණ, ඩිජිටල් උපකරණ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (xxx) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(xxxi) එකතු කළ අගය මත බදු විලම්බනය කරනු ලැබ ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද, එම කොන්දේසිවලටම යටත්ව, 2011 ජූනි මස 1 වන දිනට පසුව ආනයනය කරන ලද ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා යන්ත්‍රසූත්‍ර හෝ ඒ ඖෂධ නිෂ්පාදන යන්ත්‍රසූත්‍ර සඳහා වූ අමතර කොටස් ද ඇතුළත්ව, රේගු කාර්ය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ, නිශ්චිතව දක්වා ඇති, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිර්දේශ කරන ලද හා ඖෂධ නිෂ්පාදකයන් විසින් ආනයනය කරන ලද, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු නොලබන ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර සහ ඒ ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර සඳහා වන අමතර කොටස්;

(xxxii) එකතු කළ අගය මත බදු විලම්භනය කරනු ලැබ ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද, එම කොන්දේසිවලටම යටත්ව, 2011 ජූනි මස 1 වැනි දිනට පසුව ආනයනය කරන ලද, ජෛව ස්කන්ධ කැට සහ තැටි නිෂ්පාදනය සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර ද ඇතුළත්ව, ඒ නිෂ්පාදනව නිෂ්පාදකයා විසින් ආනයනය කරන ලද, රේගු කාර්ය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ නිශ්චිතව දක්වා ඇති, ජෛව ස්කන්ධ කැට සහ තැටි නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන යන්ත්‍ර සූත්‍ර;

(xxxiii) යම් වර්ගයක කෘෂිකාර්මික නිෂ්පාදන හෝ පැළ වගාකරුවකු විසින් ආනයනය කරන ලද, කෘෂිකර්ම ආමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරන හරිතාගාර, පොලිටනල් හා හරිතාගාර ඉදිකිරීම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය;

(xxxiv) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16ඇ සහ 17අ වගන්ති යටතේ බදු නිදහස් කිරීමක් සඳහා සුදුසුකම් ලබන යම් ව්‍යවසායයක් විසින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග එළඹෙන ලද ගිවිසුමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබුවා වූ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලපරිච්ඡේදය තුළ එම ගිවිසුමේ සඳහන් කොන්දේසි ඉටු කිරීමට යටත්ව බදු විලම්භනය කරනු ලබන්නා වූ ද කාර්ය සඳහා ඒ ව්‍යවසායයේ ප්‍රයෝජන පිණිස ආනයනය කරනු ලබන පිරියත, යන්ත්‍රසූත්‍ර හෝ උපකරණ;

(xxxv) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම, සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම, හෝ සීමාසහිත එයාර් ලංකා කේටරින් සර්විසස් සමාගම වෙත පවරා දී ඇති ජාත්‍යන්තර ප්‍රවාහන කාර්යයක් වන සේවා සැපයීමේ කාර්ය සඳහා අවශ්‍ය (පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වූ මෝටර් රථ හා භාණ්ඩ නොවන) යම් භාණ්ඩ;

(xxxvi) ආනයනය කිරීමේ දී කිලෝග්‍රෑම් එකකට රුපියල් හැත්තෑපහක සෙස් බද්දක් අයකිරීමට යටත්ව, යම් අගය එකතු කිරීමෙන් තොරව දේශීය වෙළඳපොළෙහි අලෙවි කිරීම පිණිස වූ, රේගු කාර්ය සඳහා වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ නිශ්චිතව දක්වා ඇති රෙදිපිළි.".

6. මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වන යම් කාලසීමාවක් ඇතුළත, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එකතු කළ අගය මත බදු එකතු කරන යම් තැනැත්තකු, නිසි බලය ඇතිව ක්‍රියාකර ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එවැනි එකතු කිරීමක් සියලු කාර්ය සඳහා වලංගු ලෙස සිදු කර ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එම තැනැත්තා එවැනි යම් එකතු කිරීමක් සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව මෙයින් හානිපූර්ණය කරනු ලැබේ.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2012 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. (1) මේ පනත 2012 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන 2012 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක විය යුතු ය:

එසේ වුව ද—

(අ) මේ පනතේ 2 (2) වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තියට කරන ලද සංශෝධන;

(ආ) මේ පනතේ 6 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇ වගන්තියට කරන ලද සංශෝධන;

(ඇ) මේ පනතේ 9 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තියට කරන ලද සංශෝධන;

(ඈ) (i) මේ පනතේ 15(1) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (2) වන උපවගන්තියට (ණ) අලුත් ඡේදය එකතු කිරීමෙන් ඒ උපවගන්තියට කරන ලද සංශෝධන ; සහ

(ii) මේ පනතේ 15(2) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයට එකතු කරන ලද (x) අලුත් අනුඡේදයේ (අ) අයිතමය සහ (ආ) ඡේදයට එකතු කරන ලද (ix) අලුත් අනුඡේදයේ (අ) අයිතමය මගින් ඒ උපවගන්තියට කරන ලද සංශෝධන,

2011 අප්‍රේල් මස 1 වන දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

2. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ—

(අ) (xxviii) වන අනුඡේදයේ "1982 අංක 17 දරන සමාගම් පනතේ VIII වන කොටස" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2007 අංක 7 දරන සමාගම් පනතේ XI වන කොටස" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (lxi) වන අනුඡේදයේ "2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලාභ සහ ආදායම්;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) (lxi) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන්:—

"(lxii) 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ; සහ

(lxiii) 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත මගින් පිහිටුවන ලද අරමුදලේ;";

(2) එම වගන්තියේ (ඉ) ඡේදයේ—

(අ) "ඒ පුණ්‍යායතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව උපචිත වන ලාභ වන්නා වූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඒ පුණ්‍යායතනය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක ලාභ වන්නා වූ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "යම් ව්‍යාපාරයක ලාභ" යන වචන වෙනුවට "යම් ව්‍යාපාරයක 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන ලාභ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

3. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "දෙන ලද ණයක්, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්," යන වචන වෙනුවට,

"දෙන ලද ණයක්—

(i) 2012 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ප්‍රදානය කරනු ලැබ ඇත්නම් හා එය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම් ; හෝ

(ii) 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ප්‍රදානය කරනු ලැබ ඇත්නම්,"

යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;.

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "දෙන ලද ණයක්, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්," යන වචන වෙනුවට,

"දෙන ලද ණයක්—

(i) 2012 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ප්‍රදානය කරනු ලැබ ඇත්නම් හා එය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම් ; හෝ

(ii) 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ප්‍රදානය කරනු ලැබ ඇත්නම්,"

යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;.

4. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ 1 වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (එ) ඡේදයේ "ඉන් පසු එක් වර්ෂයක් ඇතුළත නම්," යන වචන වෙනුවට "ඉන් පසු එක් වර්ෂයක් ඇතුළත නම්;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයේ "එම ලාභාංශය." යන වචන වෙනුවට "එම ලාභාංශය;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ඔ) යම් සමාගමක 16ඇ සහ 17අ වගන්ති යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර ඇති ලාභ හා ආදායමින්, ඒ ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන ලද කාලසීමාව තුළ දී ඒ සමාගමේ කොටස් හිමියකුට ගෙවනු ලබන යම් ලාභාංශයක්:

එසේ වුව ද, එම සමාගම යම් ඉදි කිරීමේ ව්‍යාපෘතියක යෙදී සිටින වාසික සමාගමක් වන අවස්ථාවක දී එම නිදහස් කිරීම, එම ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කර ඇති කාලසීමාව තුළ හෝ ඉන් පසු එක් අවුරුද්දක කාලසීමාවක් ඇතුළත එම සමාගම විසින් ගෙවනු ලබන යම් ලාභාංශයක් සඳහා අදාළ විය යුතුය.".

5. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම ඡේදයේ (ත) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(තත) යම් ඒකක භාරයක හෝ අන්‍යෝන්‍ය අරමුදලක ඒකකයක් නිදහස් කිරීමෙන් යම් තැනැත්තකුට උපචිත වන ලාභ සහ ආදායම;";

(2) එම වගන්තියේ (න) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(නන) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන හා යම් ක්‍රීඩා පුහුණුකරුවකු වශයෙන් ශ්‍රී ලංකාවට ගෙන්වන ලද යම් පුද්ගලයකු ශ්‍රී ලංකාව තුළ යම් ක්‍රීඩාවක පුහුණුකරුවකු වශයෙන් කටයුතු කිරීම තුළින් ලැබුණු ලාභ සහ ආදායම;";

(3) (බබබබබබ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "17අ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "16ඇ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) (මමමමම) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(මමමමමම) ශ්‍රී ලංකාවේ වාසික යම් තැනැත්තකුට ශ්‍රී ලංකාවට පිටතින් විදේශ ව්‍යවහාර මුදල්වලින් ලැබෙන සහ බැංකුවක් මගින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන යම් රාජ්‍ය භාගයක්;";

(5) එම වගන්තියේ (යයයයය) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(යයයයයය) යම් ක්‍රීඩා පිටියක්, ක්‍රීඩාංගනයක් හෝ ක්‍රීඩා සංකීර්ණයක් පරිපාලනය කිරීමෙන් යම් තැනැත්තකුට ලැබෙන හෝ උපචිත වන ලාභ සහ ආදායම්.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "වර්ෂ තුනක කාලසීමාවක් සඳහා" යන වචන වෙනුවට "මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම්වලට සහ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ආයෝජනයට අනුරූපවන III වන තීරයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන උපලේඛනය ඇතුළත් කිරීමෙන්:—

"උපලේඛනය

| I වන තීරය (ක්‍රියාකාරකම්) | II වන තීරය (ආයෝජනය කළ මුදල රුපියල් වලින්) | III වන තීරය (බදු නිදහස් කිරීමේ කාලය) |
|---|---|---|
| (සැකසුම් කිරීම ඇතුළුව) කෘෂිකර්මය, සත්ව පාලනය හෝ මාළු ඇල්ලීම, චිත්‍ර ශිල්පියකුගේ නිර්මාණ ඇතුළුව නිර්මාණාත්මක කටයුතු, තොරතුරු තාක්ෂණය | මිලියන 25ට නොඅඩු එහෙත් මිලියන 50ට අඩු | අවුරුදු 4 |
| කෘෂිකර්මාන්තයට සම්බන්ධ සේවාවක් ඇතුළත් නොවන, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාකාරකමක් (නිෂ්පාදනයෙන් 50% කට වැඩි ප්‍රමාණයක් දේශීය වෙළෙඳපොළෙහි විකිණීමට අපේක්ෂිත නම්, අවම වශයෙන් 35% ක එකතු කළ අගයක් නිෂ්පාදනවල තිබිය යුතු ය.) | මිලියන 50ට නොඅඩු එහෙත් මිලියන 100ට අඩු | අවුරුදු 4 |
| | මිලියන 100ට නොඅඩු එහෙත් මිලියන 200ට අඩු | අවුරුදු 5 |
| | මිලියන 200ට නොඅඩු | අවුරුදු 6". |

(3) එම වගන්තියේ 2 වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා "අලුත් ව්‍යවසායක්" යන්නෙන්—

(අ) (i) කෘෂිකර්මය, සත්ව පාලනය හෝ මාළු ඇල්ලීම;

(ii) යම් මත්පැන් හෝ යම් දුම්කොළ නිෂ්පාදනයක් නොවන (ඒ භාණ්ඩය සැකසුම් කිරීම ද ඇතුළුව) යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම;

(iii) තොරතුරු තාක්ෂණ සේවාවන් සැපයීම;

(iv) මෘදුකාංග සංවර්ධනය;

(v) ව්‍යාපාරික ක්‍රියාවලිය බහිර් අර්පණය කිරීම;

(vi) අධ්‍යාපන ක්‍රියාවලිය බහිර් අර්පණය කිරීම;

(vii) සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැපයීම;

(viii) අධ්‍යාපන සේවා සැපයීම;

(ix) රූපලාවන්‍ය සේවා සැපයීම;

(x) ශීත කාමර සහ ගබඩා පහසුකම් සැපයීම;

(xi) සංචාරක ව්‍යාපාරය;

(xii) ශරීර සුවතා මධ්‍යස්ථාන සේවා සැපයීම හෝ ක්‍රීඩා සඳහා පහසුකම් සැපයීම;

(xiii) චිත්‍ර ශිල්පියකුගේ නිර්මාණ ඇතුළු නිර්මාණාත්මක කටයුතු;

(xiv) කුඩා ජල විදුලි ව්‍යාපෘති;

යන කාර්යයන්හි නිරතව සිටින,

(ආ) 2011 මාර්තු මස 31 වන දිනට පසුව, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව (1) වන උපවගන්තියේ දැක්වෙන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අනුරූප මුදලට අඩු නොවන මුදලක් එහි ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා ආයෝජනය කරන; සහ

(ඇ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව වාණිජ කටයුතු ආරම්භ කරන,

යම් ව්‍යවසායක් අදහස් වේ."

මේ වගන්තියේ කාර්යය සඳහා "ආයෝජනය කළ මුදල" යන්නෙන්, යම් ඉඩමක්, පිරියත, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වෙනත් ස්ථාවර වත්කම්වල පිරිවැය අදහස් වේ.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16ඇ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 16ඈ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

16ඈ. 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව පිහිටුවනු ලැබුවා වූ ද, මෙහි උපලේඛනයේ II වන තීරයේ අනුරූපී අවම ආයෝජනයට අඩු නොවන මුදලක් සහිතව එම උපලේඛනයේ I වන තීරයේ සඳහන් යම් භාණ්ඩ නිෂ්පාදනයෙහි නිරතව සිටින්නා වූ ද, යම් නව ව්‍යාවසායක (යම් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් ලැබුණ ලාභ සහ ආදායම් හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායම, එම ව්‍යාවසාය විසින් එම තක්සේරු වර්ෂය තුළ දී සිදු කරන ලද ගනුදෙනුවලින් ලාභ ඉපයීම ආරම්භ කළේ යම් තක්සේරු වර්ෂයක ද, එම තක්සේරු වර්ෂය ආරම්භයේ සිට හෝ එම ව්‍යාවසාය විසින් වාණිජ කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට වසර දෙකක කාලසීමාවක් සම්පූර්ණ වන තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට, යන මෙයින් කලින් එළඹෙන වර්ෂයේ සිට ගණන් බලනු ලබන වසර පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

**උපලේඛනය**

| I වන තීරය (නිෂ්පාදනය) | II වන තීරය (අවම ආයෝජනය ඇ.එ.ජ. ඩොලර් මිලියන වලින්) |
|---|---|
| රෙදි | 5 |
| ඖෂධ | 10 |
| කිරිපිටි | 30 |
| සිමෙන්ති | 50". |

8. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "එවැනි ව්‍යාවසායක ආයෝජනය කරන ලද රුපියල් මිලියන දහයක අවම ආයෝජනයක්" යන වචන වෙනුවට "2012 මාර්තු මස 31 වන දිනයට පසුව එළඹෙන දිනයක් නොවන දිනයක එවැනි ව්‍යාවසායක ආයෝජනය කරන ලද රුපියල් මිලියන දහයක අවම ආයෝජනයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "ආයෝජන නිර්නායක යටතේ සුදුසුකම්ලත් සමාගමක්" යන වචන වෙනුවට "ආයෝජන නිර්නායක යටතේ සුදුසුකම් ලත් සහ 2002 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව සංස්ථාගත කරනලද සමාගමක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක්" යන වචන වෙනුවට "2012 මාර්තු මස 31 වන දිනයට පසුව එළඹෙන දිනයක් නොවන දිනයක ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ —

(අ) "වර්ෂයේ සිට අවුරුදු පහක කාලසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය:" යන වචන වෙනුවට "වර්ෂයේ සිට මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දැක්වෙන ආයෝජනයට අනුරූප වන එම උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය:" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන්:—

"උපලේඛනය

| I වන තීරය (ආයෝජනය රුපියල් මිලියන වලින්) | II වන තීරය (බද්දෙන් නිදහස් කාලසීමාව) |
|---|---|
| 300ට වැඩි සහ 500ට නොවැඩි | අවුරුදු 6 |
| 500ට වැඩි සහ 700ට නොවැඩි | අවුරුදු 7 |
| 700ට වැඩි සහ 1000ට නොවැඩි | අවුරුදු 8 |
| 1000ට වැඩි සහ 1500ට නොවැඩි | අවුරුදු 9 |
| 1500ට වැඩි සහ 2500ට නොවැඩි | අවුරුදු 10 |
| 2500ට වැඩි | අවුරුදු 12"; |

(2) ඒ වගන්තියේ 2 වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා "අලුත් ව්‍යවසායක්" යන්නෙන්—

(අ) පහත නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාකාරකමක—

(i) බෝට්ටු, ඖෂධ, ටයර් සහ ටියුබ්, මෝටර් රථ අමතර කොටස්, ලී බඩු, සෙරමික්, වීදුරු භාණ්ඩ හෝ වෙනත් ඛනිජ ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන, රබර් ආශ්‍රිත නිෂ්පාදන, විලවුන් නිෂ්පාදන, දේශීයව වගා කරන ලද කෘෂි නිෂ්පාදන ආශ්‍රයෙන් නිෂ්පාදිත ආහාර නිෂ්පාදන, ඉදි කිරීම් අමුද්‍රව්‍ය හෝ විදුලි හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ නිෂ්පාදනය කිරීම;

(ii) මුළු නිෂ්පාදනයෙන් සියයට අනූවකට නොඅඩු ප්‍රමාණයක් සහ, ඇඟලුම් සම්බන්ධයෙන් වන විට මුළු නිෂ්පාදනයෙන් සියයට හැත්තෑ පහකට නොඅඩු ප්‍රමාණයකින් සංයුක්ත විය යුතු, වක්‍ර අපනයනය ද ඇතුළුව, අපනයනය සඳහා සම්ප්‍රදායික නොවන භාණ්ඩ නිෂ්පාදනය කිරීම, සෑදීම හෝ සැකසීම;

(iii) ආහාර බෝග හෝ කාර්මික බෝග වගා කිරීම;

(iv) උද්‍යාන වගාව;

(v) වන වගාව;

(vi) කිරි නිෂ්පාදනය, කුකුළන්, ඌරන්, එළුවන් ආදී සතුන් හා සම්බන්ධ සත්ත්ව පාලනය;

(vii) ගෙවීම්වල මුළු වටිනාකමින් සියයට හැත්තෑවකට නොඅඩු ප්‍රමාණයක්, පරිවර්තනය කළ හැකි විදේශ ව්‍යවහාර මුදලින් ගෙවනු ලැබිය යුතු වූ සේවාවන් ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට සැපයීම;

(viii) සංචාරක ව්‍යාපාරය හෝ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ව්‍යාපෘති;

(ix) හෝටල්, ආගන්තුක නිවාස හෝ සමාන සේවාවන්;

(x) වාණිජ ගොඩනැගිලි ඉදි කිරීම ඇතුළුව යටිතල පහසුකම් ව්‍යාපෘති;

(xi) බඩු ගබඩා සහ ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම;

(xii) පුනර්ජනනීය සම්පත් භාවිතයෙන් විදුලි බල උත්පාදනය;

(xiii) කාර්මික ජනපද, විශේෂිත ආර්ථික කලාප හෝ දැනුම් පුරවර පිහිටුවීම;

(xiv) නාගරික නිවාස හෝ නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය;

(xv) සනීපාරක්ෂක සේවා හෝ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති සැපයීම;

(xvi) ජල සැපයුම් සේවා සංවර්ධනය කිරීම;

(xvii) අභ්‍යන්තර ජල මාර්ග සංවර්ධනය කිරීම හෝ ඒ ආශ්‍රිත (භාණ්ඩ හෝ මගීන්) ප්‍රවාහන කටයුතු;

(xviii) ආරෝග්‍ය ශාලා ඉදි කිරීම සහ සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැලසීම;

(xix) ගුවන් යානා හෝ සමුද්‍රීය යාත්‍රා අළුත්වැඩියා කිරීම හෝ නැව් කැඩීම;

(xx) ක්‍රීඩා සේවා (උදාහරණ: මෝටර් රථ ධාවන තරග හෝ ගොල්ෆ් ක්‍රීඩා පිටි);

(xxi) තොරතුරු තාක්ෂණය;

(xxii) මෘදුකාංග සංවර්ධනය;

(xxiii) ව්‍යාපාර හෝ දැනුම් ක්‍රියාවලිය බහිර් අර්පණය කිරීම;

(xxiv) සැහැල්ලු හෝ බර ඉංජිනේරු කර්මාන්තයේ යම් ව්‍යාපෘතියක්;

(xxv) ගවයන් කෘත්‍රිම සිංචනය කිරීම (කිරි නිෂ්පාදන සංවර්ධනය);

(xxvi) අධ්‍යාපන සේවා සැපයීම ; හෝ

(xxvii) ජාතික ආර්ථිකයේ සංවර්ධනය සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රියාකාරකමක නිරතව සිටින ; සහ

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව වාණිජ කටයුතු ආරම්භ කරන,

යම් ව්‍යවසායක් අදහස් වේ.'';

(3) එම වගන්තියේ පැති සටහනේ ''නියම කරනු ලබන ක්‍රියාකාරකම්වල නිරත'' යන වචන වෙනුවට ''නිශ්චිතව දක්වන ලද යම් ක්‍රියාකාරකම්වල නිරත'' යන වචන ආදේශ කිරීමෙන්.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ''එම ව්‍යවසාය ආරම්භ කිරීමේ දින සිට එක් අවුරුද්දක් ඇතුළත'' යන වචන වෙනුවට ''එම ව්‍යවසාය ආරම්භ කිරීමේ දින සිට එක් අවුරුද්දක් ඇතුළත, එහෙත් 2012 මාර්තු මස 31 වන දිනට පසුව එළඹෙන දිනයක් නොවන දිනයක'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (6) වන උපවගන්තියේ ''අවදානම් ප්‍රාග්ධන සමාගම'' යන යෙදුමේ අර්ථ නිරූපණයේ ''1982 අංක 17 දරන සමාගම් පනත'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''2007 අංක 7 දරන සමාගම් පනත'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ (ඇ) ඡේදයේ ''2007 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව අත්කර ගත්'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''2007 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අත්කර ගත්'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

''(ඈ) බලශක්ති කාර්යක්ෂමතා කාර්යය සඳහා 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව යම් අධි තාක්ෂණික පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ කිසිවක් අත්කර ගනු ලබන අවස්ථාවක දී අනුප්‍රමාණය, අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට පනහක් විය යුතු ය;''

(3) ඒ වගන්තියේ (එ) ඡේදයේ ''සියයට දෙසීයකට සමාන යම් ප්‍රමාණයක්;'' යන වචන වෙනුවට, පහත සඳහන් වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:—

''සියයට දෙසීයකට සමාන යම් ප්‍රමාණයක් :

එසේ වුව ද, ඒ පර්යේෂණ කරගෙන යනු ලබන්නේ යම් රාජ්‍ය ආයතනයක් හරහා නම්, 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන අඩු කිරීම, ඒ තැනැත්තා විසින් දරන ලද ඒ වියදමෙන් සියයට තුන්සියයකට සමාන මුදලක් විය යුතු ය;

මේ ඡේදයේ කාර්යය සඳහා—

(i) ''රාජ්‍ය ආයතනය'' යන්නට, රජය විසින් සියයට පනහක හෝ ඊට වැඩි ප්‍රමාණයක කොටස් දරන යම් සමාග මක් ඇතුළත් වේ; සහ

(ii) ''විද්‍යාත්මක, කාර්මික, කෘෂිකාර්මික හෝ වෙනත් යම් පර්යේෂණ'' යන්නෙන්, නිෂ්පාදන හෝ නිෂ්පාදිත නවෝත්පාදනය සඳහා හෝ යම් නිෂ්පාදනයක, නිෂ්පාදිතයක හෝ සේවාවක ගුණාත්මකභාවය හෝ ස්වභාවය වැඩි දියුණු කිරීම සඳහා කරගෙන යනු ලබන යම් පර්යේෂණ අදහස් වන අතර, ඊට යම් වෙළෙඳපොළ පර්යේෂණ හෝ ශක්‍යතා අධ්‍යයන ඇතුළත් නොවේ.;

(4) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයේ අතුරු විධානයේ (i) වන අනුඡේදයේ ''මේ පනතේ XIV පරිච්ඡේදය'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''මේ පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ණ) ඡේදය යටතේ නිදහස් කොට නොමැති අවස්ථාවක මේ පනතේ XIV පරිච්ඡේදය'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(5) එම උපවගන්තියේ (ණ) ඡේදයේ ''එම සමාගමේ මුල් මහජන කොටස් නිකුතුවේ අගයෙන් සියයට එකක් නොඉක්මවන තාක්දුරට එම තක්සේරු වර්ෂයේ දී සමාගම විසින් දරන ලද එකී කොටස් නිල ලැයිස්තුගත කිරීමේ වියදම්'' යන

වචන වෙනුවට "එම සමාගමේ මුල් මහජන කොටස් නිකුතුවේ අගයෙන් සියයට එකක් නොඉක්මවන තාක්දුරට එම තක්සේරු වර්ෂයේ දී සමාගම විසින් දරන ලද එකී කොටස් නිල ලැයිස්තුගත කිරීමේ වියදම්;" යන වචන ආදේශ කිරීමෙන්;

(6) එම උපවගන්තියේ (ණ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(ත) යම් ක්‍රීඩා පිටියක්, ක්‍රීඩාංගණයක් හෝ ක්‍රීඩා සංකීර්ණයක් නඩත්තු කිරීමේ දී හෝ කළමනාකරණය කිරීමේ දී යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදමක්.".

13. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "සේවාවන් සැපයීම, සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන්වල දී" යන වචනවල සිට "අඩු කරනු ලැබිය යුතු ය;" යන වචන දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:—

"සේවාවන් සැපයීම; හෝ

(iii) මෝස්තර සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය හෝ නිෂ්පාදන නවෝත්පාදනය හා සම්බන්ධ සේවාවන් සැපයීමෙහි ම නිරතව සිටින යම් සමාගමක් විසින් ඒ සේවාවන් සැපයීම,

සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන්වල දී දරන ලද වියදම් නොවන, ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම්:"

එසේ වුව ද, 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

(අ) ඒ තැනැත්තා විසින්—

(i) යම් භාණ්ඩයක හෝ ද්‍රව්‍යයක අපනයන වෙළෙඳාම නංවාලීම හෝ විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම සඳහා යම් සේවාවන් සැපයීමේ දී ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදම්; හෝ

(ii) (ඇ) ඡේදයේ සඳහන් පරිදි අනුමත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදම්; හෝ

(iii) 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මෝස්තර සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය හෝ නිෂ්පාදන නවෝත්පාදනය හා සම්බන්ධ සේවාවන් සැපයීමෙහි ම නිරතව සිටින යම් සමාගමක් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදම් ;"

අඩු කිරීමෙන් පසු ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි පවත්වාගෙන යනු ලබන නැතහොත් කරගෙන යනු ලබන යම් වෙළෙඳාමකින් හෝ ව්‍යාපාරයකින් ලාභ හෝ ආදායම් ඉපැයීම පිණිස ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදමේ කොටස ; හෝ

(ආ) ඒ වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ඊට පෙරාතුවම වූ තක්සේරු වර්ෂයේ ලාභ සහ ආදායම්වලින් සියයට දෙකකට සමාන ප්‍රමාණයක්,

යන්නෙන් අඩු ප්‍රමාණය, එම වෙළෙඳාමෙන් හෝ ව්‍යාපාරයෙන් එකී තක්සේරු වර්ෂය සඳහා ලැබුණ ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී අඩු කරනු ලැබිය යුතු ය";

(2) (ඩ) ඡේදයේ අතුරු විධානයේ "1982 අංක 17 දරන සමාගම් පනතින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2007 අංක 7 දරන සමාගම් පනතින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;."

14. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීම මගින් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"(ඉ) වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන පන්සියයක් නොඉක්මවන යම් ව්‍යාපාරයක් යම් තැනැත්තකු විසින් ආරම්භ කරනු ලබන අවස්ථාවක දී, ඒ ව්‍යාපාරයේ වාණිජ මෙහෙයුම් ආරම්භ වූ තක්සේරු වර්ෂයට පෙරාතුවම වූ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තා විසින් දරන ලද ප්‍රාග්ධන වියදම් හැර, යම් ආරම්භ කිරීමේ වියදමක් වාණිජ මෙහෙයුම් ආරම්භ වූ තක්සේරු වර්ෂය සඳහා වන එම තැනැත්තාගේ සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායමින් අඩු කරනු ලැබිය යුතු ය.".

15. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. :—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ —

(අ) (ජ) ඡේදයේ "යම් සමාගමක් විසින් දරන ලද වියදමක්; සහ" යන වචන වෙනුවට "යම් සමාගමක් විසින් දරන ලද වියදමක්;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ට) ඡේදයේ "ආයෝජනය කරන ලද යම් මුදලක්." යන වචන වෙනුවට "ආයෝජනය කරන ලද යම් මුදලක්;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (ට) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:—

"(ඩ) ආර්ථික වශයෙන් පසුබෑමකට ලක්ව ඇතැයි කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනාගනු ලැබූ සහ ගැසට් පත්‍රයේ පළකරන ලද යම් ගමක පවත්වාගෙන යනු ලබන යම් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක දී යම් තැනැත්තකු විසින් දරන ලද වියදමක්;

(ණ) 16ඇ හෝ 17අ යන වගන්ති යටතේ බද්දෙන් නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලබන යම් ව්‍යවසායක්, එම ව්‍යවසාය 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ව්‍යාපාරික කටයුතු ආරම්භ කර ඇත්නම් සහ එම ව්‍යවසාය පුළුල් කිරීමේ දී යම් තැනැත්තකු විසින් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු, එහෙත් 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර ස්ථාවර වත්කම් වශයෙන් කරන ලද රුපියල් මිලියන පනහකට අඩු නොවන ආයෝජනයක්; සහ

(ත) 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව යම් ව්‍යවසායක් විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කර ඇත්නම්, මේ පනතේ 16ඇ වගන්තිය යටතේ එම ව්‍යවසාය බදුවලින් නිදහස් වීම සඳහා සුදුසුකම් ලබන ආයෝජනයක් වන අවස්ථාවක, 16ඇ වගන්තියේ උපලේඛනයේ I වන තීරයේ සඳහන් යම් නිෂ්පාදනයක් නිපදවීමේ නිරතව සිටින යම් ව්‍යවසායක ස්ථාවර වත්කම් වශයෙන් කරන ලද මේ පනතේ 16ඇ වගන්තියේ උපලේඛනයේ II වන තීරයේ සඳහන් මුදලකට වඩා අඩු නොවන ආයෝජනයක්."

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ —

(අ) (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ "(ග), (ච), සහ (ට) යන ඡේදවල" යන වචන වෙනුවට "(ග), (ච), (ට), (ඩ), (ණ) සහ (ත) යන ඡේදවල" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (අ) ඡේදයේ (viii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන්:—

"(ix) ඒ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තා විසින් කරන ලද (2) වන උපවගන්තියේ (ඩ) ඡේදයේ සඳහන් සුදුසුකම් ලැබීමේ සියලු ගෙවීම් වෙනුවෙන් රුපියල් මිලියන එකක් නොඉක්මවිය යුතු ය;

(x) (2) වන උපවගන්තියේ—

(අ) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද (ණ) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම වෙනුවෙන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය :

එසේ වුව ද, එක් තක්සේරු වර්ෂයකට වඩා වැඩි තක්සේරු වර්ෂ ගණනක් තුළ කරනු ලබන ආයෝජන ප්‍රමාණය සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් අඩු කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනයට ළඟාවීම සඳහා එකතු කරනු ලබන අවස්ථාවක දී, (2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන) යම් පෙර තක්සේරු වර්ෂයක දී කරන ලද එකී ආයෝජනය, රුපියල් මිලියන පනහක මුළු මුදල වෙත ළඟා වූයේ යම් තක්සේරු වර්ෂයක දී ද, එම තක්සේරු වර්ෂය තුළ කරනු ලබන ආයෝජනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද (ත) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම වෙනුවෙන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය :

එසේ වුව ද, එක් තක්සේරු වර්ෂයකට වඩා වැඩි තක්සේරු වර්ෂ ගණනක් තුළ කරනු ලබන ආයෝජන ප්‍රමාණය සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් අඩු කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනයට ළඟාවීම සඳහා එකතු කරනු ලබන අවස්ථාවක දී, (2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන යම් පෙර තක්සේරු වර්ෂයක දී කරන ලද එකී ආයෝජනය, 59ඈ වගන්තියේ සඳහන් අදාළ අවම ආයෝජනය වෙත ළඟා වූයේ යම් තක්සේරු වර්ෂයක දී ද, එම තක්සේරු වර්ෂය තුළ කරනු ලබන ආයෝජනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.;"

(ඇ) (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ "(ග) (ච) සහ (ට) යන ඡේදවල", යන වචන වෙනුවට "(ග), (ච), (ට), (ඩ), (ණ) සහ (ත) යන ඡේදවල" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) (ආ) ඡේදයේ (vii) වන අනුඡේදයේ "රුපියල් මිලියන දහයක් නොඉක්මවිය යුතු ය." යන වචන වෙනුවට "රුපියල් මිලියන දහයක් නොඉක්මවිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) (ආ) ඡේදයේ (vii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේද එකතු කිරීමෙන්:—

"(viii) ඒ සමාගම විසින් එම තක්සේරු වර්ෂයේ දී කරන ලද (2) වන උපවගන්තියේ (ඩ) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් සම්බන්ධයෙන් වන විට දී, රුපියල් මිලියන දහයක් නොඉක්මවිය යුතු ය;

(ix) ඒ සමාගම විසින් කරන ලද (2) වන උපවගන්තියේ—

(අ) ඒ තක්සේරු වර්ෂයේ දී සමාගම විසින් කරන ලද (ණ) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් වෙනුවෙන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය :

එසේ වුව ද, එක් තක්සේරු වර්ෂයකට වඩා වැඩි තක්සේරු වර්ෂ ගණනක් තුළ කරනු ලබන ආයෝජන ප්‍රමාණය සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් අඩු කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනයට ළඟාවීම සඳහා එකතු කරනු ලබන අවස්ථාවක දී, (2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන) යම් පෙර තක්සේරු වර්ෂයක දී කරන ලද එකී ආයෝජනය, රුපියල් මිලියන පනහක මුළු මුදල වෙත ළඟා වූයේ යම් තක්සේරු වර්ෂයක දී ද, එම තක්සේරු වර්ෂය තුළ කරනු ලබන ආයෝජනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

(ආ) ඒ තක්සේරු වර්ෂයේ දී සමාගම විසින් කරන ලද (ත) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් වෙනුවෙන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය :

එසේ වුව ද, එක් තක්සේරු වර්ෂයකට වඩා වැඩි තක්සේරු වර්ෂ ගණනක් තුළ කරනු ලබන ආයෝජන ප්‍රමාණය සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් අඩු කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනයට ළඟාවීම සඳහා එකතු කරනු ලබන අවස්ථාවක දී, (2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන) යම් පෙර තක්සේරු වර්ෂයක දී කරන ලද එකී ආයෝජනය, 59ඇ වගන්තියේ සඳහන් අදාළ අවම ආයෝජනය වෙත ළඟා වූයේ යම් තක්සේරු වර්ෂයක දී ද, එම තක්සේරු වර්ෂය තුළ කරනු ලබන ආයෝජනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

(3) එම වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(7අ) 4 වන උපවගන්තියේ (අ) ඡේදයේ (x) වන අනුඡේදයේ හෝ (ආ) ඡේදයේ (ix) වන අනුඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමෙන් සියයට හැත්තෑපහක් එම තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම අනුප්‍රාප්ත වන තක්සේරු වර්ෂ තුනක කාලසීමාවක් තුළ සමාන ප්‍රමාණවලින් විභාජනය කරනු ලැබිය හැකි අතර එසේ විභාජනය කරනු ලැබූ මුදල ඒ එක් එක් තක්සේරු වර්ෂය තුළ එම තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු බවට සලකනු ලැබිය යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "පළමුවන උපලේඛනයේ I වන කොටසේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පළමුවන උපලේඛනයේ I වන කොටසේ, Iඅ කොටසේ හෝ Iආ කොටසේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "පළමුවන උපලේඛනයේ I වන කොටසේ" යන වචන සහ ඉලක්කම් එම උපවගන්තියේ දැක්වෙන කවර හෝ ස්ථානයක දී ඒ වෙනුවට "පළමුවන උපලේඛනයේ I වන කොටසේ, Iඅ කොටසේ හෝ Iආ කොටසේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

17. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(අ) (ii) වන අනුඡේදයේ "පාරවල් හෝ පාලම්; හෝ" යන වචන වෙනුවට "පාරවල් හෝ පාලම්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (iii) වන අනුඡේදයේ "ජලපවාහන හෝ කසල ඉවත් කිරීමේ පද්ධති" යන වචන වෙනුවට "ජලාපවහන හෝ කසළ ඉවත්කිරීමේ පද්ධති; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (iii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන්:—

"(iv) වරායක්, ගුවන් තොටුපළක් හෝ යම් විදුලි සංදේශ හෝ විදුලි බල යටිතල පහසුකම් ව්‍යාපෘතියක්;"

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 48ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

48ආ. 16ඈ වගන්තිය යටතේ සඳහන් කරන ලද බදු නිදහස් කාලසීමාව අවසන් වන දිනයට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමේ 16ඈ වගන්තියේ සඳහන් යම් ක්‍රමෝපාය ආනයන ප්‍රතියෝජිත ව්‍යවසායකින් ලැබෙන ලාභයේ සහ ආදායමේ කොටසක් ඇතුළත් කර ඇති අවස්ථාවක මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද, මේ පනතේ පස්වන උප ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණවලට අනුව බදු අයකරනු ලැබිය යුතු ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති ව්‍යවසායකින් යම් තැනැත්තකු විසින් ලබන ලාභ සහ ආදායම" යන වචන සහ ඉලක්කම් වෙනුවට "යම් තක්සේරු වර්ෂයක් සඳහා (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති ව්‍යවසායකින් (පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ සමාගම් සමූහයක ආශ්‍රිත සමාගමක් නොවන) යම් තැනැත්තකු විසින් ලබන ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය, එම ප්‍රඥප්තියේ 59ඇ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:

59ඇ. (1) (2) වන උපවගන්තියේ සඳහන් සහ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන දැනට පවත්නා ව්‍යවසායක 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව වූ ලාභ සහ ආදායමෙන් (යම් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම හැර) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද (2) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දැක්වෙන අවම ආයෝජනය එම ව්‍යවසාය විසින් සපුරාලනු ලබන තක්සේරු වර්ෂය ආරම්භයේ සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාලයක් සඳහා මේ පනතේ පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන සුදුසු අනුප්‍රමාණ අනුව බදු අයකරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා "දැනට පවත්නා ව්‍යවසාය" යන්නෙන් මෙහි පහත II වන තීරයේ නිශ්චිතව දැක්වෙන අවම ආයෝජනයකට අනුරූපීව ස්ථාවර වත්කම් පුළුල් කිරීමක් වශයෙන් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආයෝජනය සිදු කර ඇත්තා වූ ද, මෙහි පහත I වන තීරයේ සඳහන් නිෂ්පාදන නිපදවීමේ නියැලී සිටින්නා වූ ද ව්‍යවසායක් අදහස් වේ.

| I වන තීරය (නිෂ්පාදන) | II වන තීරය (අවම ආයෝජන මුදල ඇ.එ.ජ.ඩො. වලින් හෝ සමාන අගයකින්) |
|---|---|
| රෙදි | මිලියන 5 |
| ඖෂධ | මිලියන 10 |
| කිරිපිටි | මිලියන 30 |
| සිමෙන්ති | මිලියන 50.". |

21. 2008 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (අ) ඡේදයේ "යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ" යන වචනවල සිට "ඒ නිල ලැයිස්තුගත පොදු සමාගම හෝ වෙනත් යම් සමාගම විසින්" යන වචන දක්වා, සියලුම වචන ඉවත් කර ඒ වචන වෙනුවට "යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක්, අවම වශයෙන් එක් නිල ලැයිස්තුගත සමාගමක් ඇතුළත්වන යම් සමාගම් සමූහයක සාමාජිකයකු වන වෙනත් යම් සමාගමක් හෝ රුපියල් මිලියන දෙසිය පනහකට නොඅඩු වාර්ෂික පිරිවැටුමක් සහිත හෝ වර්ෂයකට රුපියල් මිලියන එක් සියයකට නොඅඩු ශුද්ධ ලාභයක් සහිත වෙනත් යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ හෝ ක්‍රියාත්මක කරනු ලබන්නා වූ අවස්ථාවක, මේ වගන්තිය යටතේ දැන්වීමක් ඒ නිල ලැයිස්තුගත පොදු සමාගම, සමාගම් සමූහයේ වෙනත් සාමාජික සමාගම හෝ වෙනත් සමාගම වෙත දෙනු නොලැබුව ද, ඒ නිල ලැයිස්තුගත පොදු සමාගම, සමාගම් සමූහයේ වෙනත් සාමාජික සමාගම හෝ වෙනත් සමාගම විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ (අ) ඡේදයේ "යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින්" යන වචන වෙනුවට "යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක්, අවම වශයෙන් එක් සමාගමක් නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන සමාගම් සමූහයක සාමාජිකයකු වන වෙනත් යම් සමාගමක් විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "1982 අංක 17 දරන සමාගම් පනත" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2007 අංක 7 දරන සමාගම් පනත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(5) යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් ස්වකීය බදු අය කළ හැකි ආදායමෙන් සියයට පහක ප්‍රමාණයක් 2011 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වන අවුරුදු තුනක කාලයක් සඳහා හෝ එම බැංකුව හෝ මූල්‍ය ආයතනය පිහිටුවා ඇත්තේ 2011 අප්‍රේල් මස 1 වන දිනට පසුව නම් එසේ පිහිටුවනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන වාරිකවලින් ආදායම් බදු කාර්ය සඳහා මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන දිනවල දී හෝ ඒ දිනවලට පෙර කොමසාරිස් ජනරාල්වරයාගේ එකඟත්වය ඇතිව තත්කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව පිහිටුවන ලද ආයෝජන අරමුදලේ ආයෝජනය කරනු ලැබිය යුතු ය.".

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් (අ) ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අ) (i) මසකට රුපියල් පනස් දහසකට හෝ වර්ෂයකට රුපියල් හයලක්ෂයකට වැඩියෙන් පාරිශ්‍රමිකයක් ලබන;

(ii) එම සේවායෝජකයා විසින් යම් ගෙවීමක් කරන හෝ ඔහුගෙන් යම් ගෙවීමක් අයවීමට ඇති හෝ සේවා නියුක්තිකයකු ලෙස හෝ වෙනත් යම් තත්ත්වයකින් වෙනත් යම් ප්‍රතිලාභ ලබන අධ්‍යක්ෂවරයෙක් හෝ විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන ;

යම් වාසික පුද්ගලයකු ; හෝ".

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 191 වන වගන්තියේ "1982 අංක 17 දරන සමාගම් පනතෙහි" යන වචන සහ ඉලක්කම් යෙදෙන කවර හෝ ස්ථානයක "2007 අංක 7 දරන සමාගම් පනතෙහි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

26. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 217 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) "ලාභාංශ" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "ඒ සමාගමේ හෝ වෙනත් සමාගමක ණය පත්‍ර ස්වරූපයෙන් වූ යම් ලාභ බෙදා දීමක් ද;" යන වචන වෙනුවට "ඒ සමාගමේ හෝ වෙනත් සමාගමක ණය පත්‍ර ස්වරූපයෙන් වූ යම් ලාභ බෙදා දීමක්; සහ

(iv) කොටස් පත් ලාභාංශ හෝ වෙනත් ආකාරයක ලාභාංශ;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) "රාජ්‍ය සංස්ථාව" යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි "1982 අංක 17 දරන සමාගම් පනත" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2007 අංක 7 දරන සමාගම් පනත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

27. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනයේ V වන කොටසේ "I වන කොටසේ සඳහන් වන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "I වන කොටසේ, Iඅ කොටසේ හෝ Iආ කොටසේ සඳහන් වන පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

28. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ ආ කොටසේ 3 වන අයිතමයේ (ආ) ඡේදයේ "2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

29. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපලේඛනයේ 1 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"1. ඒකාබද්ධ හින්දු පවුල් —

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා — සියයට 30

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා — සියයට 24,;

(2) එම උපලේඛනයේ 3 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"3. පොල්මෑකරුවන් (අන්තිම කැමති පත්‍රය යටතේ භාරකරුවන් නොවන) සහ දේපළ භාර ගන්නන් (ඇවරකරුවන් නොවන) —

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා — සියයට 30

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා — සියයට 24 ";

(3) එම උපලේඛනයේ 4 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"4. (අන්තිම කැමති පත්‍රය යටතේ භාරකරුවන් ඇතුළුව) භාරකරුවෝ-

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 24";

(4) එම උපලේඛනයේ 5 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"5. හවුල් ව්‍යාපාර—

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 24";

(5) එම උපලේඛනයේ 6 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"6. හවුල් ව්‍යාපාර (යම් තක්සේරු කිරීමක් මත)—

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30

(ආ) 2011 අප්‍රේල් මස 1 දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 24 ";

(6) එම උපලේඛනයේ 8 වන අයිතමයේ (ආ) ඡේදයේ "2011 අප්‍රේල් මස 1 වන දිනට හෝ ඊට පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(7) එම උපලේඛනයේ 11 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"11. (ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් රාජධානියේ ආණ්ඩුව නොවන) ආණ්ඩුවල—

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 28 ";

(8) එම උපලේඛනයේ 12 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"12. 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත යටතේ ආණ්ඩුව සතු කරනු ලැබූ වෙළෙඳ ව්‍යාපාර—

(i) බදු අයකළ හැකි ආදායම මත—

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 28

(ii) (i) වන ඡේදය යටතේ ගෙවිය යුතු බද්ද අඩුකිරීමෙන් පසුව ලාභවල ඉතිරිය මත සියයට 25";

(9) එම උපලේඛනයේ 15 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"15. (ඉහත සඳහන් පළමුවන හෝ දෙවන උප ලේඛනවල සඳහන් නොවන) තැනැත්තන්-

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 30

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සියයට 28".

30. 2011 අංක 22 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපලේඛනයේ 14අ අයිතමයේ "2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම උපලේඛනයේ 33 වන අයිතමය වෙනුවට පහත දැක්වන අයිතමය ආදේශ කිරීමෙන් :—

| | |
|---|---|
| "33. 59ආ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායමට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 10 උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10" |

(3) එම උපලේඛනයේ 33 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමයන් එකතු කිරීමෙන් :—

| | |
|---|---|
| "34. 48ආ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් තැනැත්තකුට ලැබෙන ලාභයට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12. |

| | | |
|---|---|---|
| 35. | 59ඇ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් එහි සඳහන් වසර පහක කාලසීමාව තුළට අයත් වන්නා වූ තක්සේරු වර්ෂයක දී යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායමට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12. |
| 36. | 2011 නොවැම්බර් මස 21 වන දිනට පසුව පිහිටුවන ලද සංවර්ධන බැංකු කටයුතු සඳහා ම කැපවී ඇති වාණිජ බැංකුවක යම් ශාඛාවක ආදායම සඳහා අදාළ ආදායම් බදු අනුප්‍රමාණය | සියයට 24. |
| 37. | 25 වන වගන්තියේ පළමුවන උපවගන්තියේ (ඒ) ඡේදයේ සඳහන් අර්ථනිරූපණය ප්‍රකාරව, පර්යේෂණ කටයුතුවලින් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම් සඳහා අදාළ ආදායම් බදු අනුප්‍රමාණය | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 16 උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 20. |
| 38. | සෞඛ්‍ය සේවා කටයුතු සැපයීමෙන් යම් තැනැත්තකුට ලැබෙන ලාභ හා ආදායම් සඳහා අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12. |
| 39. | පිරිසිදු ශ්‍රී ලාංකීය තේ ශ්‍රී ලාංකීය වෙළෙඳ නාමයක් සහිතව අගය එකතු කළ ආකාරයට අපනයනය කිරීම සඳහා තේ අපනයනකරුවකු සමග ඒකාබද්ධ ව්‍යවසායක් පිහිටුවා ගෙන ඇති තේ වවන්නකු හෝ නිෂ්පාදකයකු එකී ඒකාබද්ධ ව්‍යවසාය මගින් තත්කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ තේ වෙන්දේසියකින් මිලදීගත් තේවලට අදාළ කළ හැකි නිෂ්පාදන ආදායම මත අදාළ ආදායම් බදු අනුප්‍රමාණය | සියයට 12. |
| 40. | (දේශීය වශයෙන්) අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදනය කිරීමේ නිරත වී සිටින යම් තැනැත්තකුට ඉන් ලැබෙන ලාභ සහ ආදායම මත අදාළ ආදායම් බදු අනුප්‍රමාණය. | පුද්ගලයකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් සියයට 12 උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 12.”. |

31. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2012 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2012 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එම පනතේ අදාළ වගන්තිවල ක්‍රියාත්මක වීමේ වෙනත් දිනයන් නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස, මේ පනත 2012 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තියේ (2) උපවගන්තියේ (iv) ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ. :—

(1) එම ඡේදයේ (2) උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන් :—

“(2) 2007 අංක 48 දරන විශේෂ භාණ්ඩ බදු පනතේ විධිවිධාන යටතේ වන සීනි, පරිප්පු, අර්තාපල් අල, ළූණු, කරවල, කිරිපිටි හෝ මිරිස් යන භාණ්ඩ ඒවායේ ආනයනකරු විසින් පසුව විකුණනු ලබන අවස්ථාවක දී එම භාණ්ඩ ; සහ ;”

(2) (3) උප ඡේදයේ "ලැබීම මත කරනු ලැබුවේ නම්." යන වචන වෙනුවට "ලැබීම මත කරනු ලැබුවේ නම්;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම ඡේදයේ (3) උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :—

"(4) (2011 ජූලි මස 01 දින සිට බලපවත්වන පරිදි) යම් මුද්‍රිත පොතක් ;

(5) අපනයනය කරනු ලබන යම් භාණ්ඩයක් ;

(6) අපනයනය කිරීම සඳහා යම් අපනයනකරුවකුට විකුණනු ලබන යම් භාණ්ඩයක් ;

(7) යම් නිෂ්පාදකයකුගෙන් හෝ නිපදවන්නෙකුගෙන් මිල දී ගනු ලබන නැවුම් කිරි, පළා වර්ග, කුරුඳු හෝ රබර්, (ඔට්ටපාලු, ක්‍රේප් රබර් හෝ රබර් ෂීට්) ; සහ

(8) ඉන්ධන පිරවුම්හලක දී විකුණනු ලබන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ "වටිනාකමට අනුපාතිකව එහි නිෂ්පාදකයාට බදු බැර හිමිවිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"වටිනාකමට අනුපාතිකව එහි නිෂ්පාදකයාට බදු බැර හිමිවිය යුතු ය :

එසේ වුවද, යම් අදාළ කාර්තුවක් සඳහා වූ එම බැර කරන ලද මුදල එම කාර්තුව සඳහා ගෙවිය යුතු බදු මුදලට වඩා වැඩි වන අවස්ථාවක, අදාළ කාර්තුවට ඉක්බිතිවම එළඹෙන කාර්තුව සඳහා වැඩිපුර ගෙවන ලද මුදල 4 වන වගන්තිය යටතේ ගෙවන ලද බදු මුදල් පෙර ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපලේඛනයේ I වන කොටසෙහි —

(අ) III අයිතමයේ "ඇත්ත වශයෙන් ම ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ" යන වචන වෙනුවට "ඇත්ත වශයෙන් ම එම අපනයනකරු විසින් ඍජුවම හෝ අපනයන කාර්ය සඳහා පිහිටුවනු ලැබූ වෙළඳ ආයතනයක් හරහා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ (2009 ජනවාරි මස 01 දින සිට බලපවත්වන පරිදි)";

(ආ) (xvi) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් අයිතමය ඇතුළත් කිරීම මගින් :—

"(xviඅ) ශ්‍රී ලන්කන් එයාර්ලයින් ලිමිටඩ්, මිහින් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් හෝ එයාර් ලංකා කේටරින් සර්විසස් ලිමිටඩ් යන සමාගම් වෙත පවරා දී ඇති ජාත්‍යන්තර ප්‍රවාහන කාර්යක් වන සේවා සැපයීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ (පෞද්ගලික භාවිතය සඳහා වූ මෝටර් රථ සහ භාණ්ඩ නොවන) යම් භාණ්ඩ ;"

(ඇ) (xxvi) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් අයිතමය ඇතුළත් කිරීම මගින් :—

"(xxvii) (2009 අගෝස්තු මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි,) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද ගුවන් යානා හෝ නැව්;

(xxviii) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද දැව දඬු;

(xxix) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද කැටි නූල්;

(xxx) (2011 දෙසැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද අන්ධ පුද්ගලයන් සඳහා සුදු සැරයටි;

(xxxi) (2011 දෙසැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද බ්‍රේල් යතුරු ලියන;

(xxxii) (2011 දෙසැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද බ්‍රේල් යතුරු ලියනවල අමතර කොටස්;

(xxxiii) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද බ්‍රේල් යතුරු ලියන කඩදාසි සහ බෝඩ්;

(xxxiv) (2011 දෙසැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද මෝටර් සවිකර ඇති හෝ එසේ නොමැතිව යාන්ත්‍රිකව ධාවනය කරනු ලබන ආබාධිත තැනැත්තන් සඳහා වූ වාහන;

(xxxv) (2011 දෙසැම්බර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද (යම් දෝෂයක් හෝ ආබාධයක් සඳහා පිළියමක් වශයෙන් පළඳිනු ලබන හෝ රැගෙන යනු ලබන හෝ ශරීරයට ඇතුළත් කර ඇති කිහිලිකරු, ශල්‍ය වෛද්‍ය පටි සහ ට්‍රසෙස් පතුරු සහ වෙනත් කැඩුම් බිඳුම් උපකරණ, ශරීරයේ කෘතිම කොටස්, ශ්‍රවණාධාර සහ වෙනත් උපකරණ ඇතුළු) විකලාංග උපකරණ;

(xxxvi) ආනයනය කරනු ලබන අවස්ථාවේ දී කිලෝ ග්‍රෑම් එකකට රු. 75 බැගින් වූ සෙස් බද්දකට යටත්වන රෙදි වර්ග;

(xxxvii) නිෂ්පාදකයා විසින් විකුණනු ලබන අවස්ථාවේ දී දේශීය වශයෙන් නිෂ්පාදිත මැටිවලින් නිර්මාණය කරන ලද උළු සහ මැටි භාණ්ඩ; සහ

(xxxviii) කලාකරුවකු විසින් විකුණනු ලබන අවස්ථාවේ දී කරනු ලබන සිත්තම්.".

5. 2012 ජනවාරි 01 දිනයෙන් ආරම්භ වන සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන සහ 5 වන වගන්ති යටතේ අවස්ථාවෝචිත පරිදි දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් මෙම පනතේ විධිවිධානවල දක්වා ඇති බදු මුදලක් මෙම පනත අදාළ වන යම් තැනැත්තකුගෙන් එකතු කරනු ලබන අවස්ථාවක දී ඒ එකතු කිරීම සියලු කාර්යයන් සඳහා වලංගු ලෙස සිදුකර ඇති බව හා කරනු ලබන ලෙසත් සළකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමට එරෙහිව අවස්ථාවෝචිත පරිදි ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබිය යුතු ය.

6. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2012 අංක 10 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2012 අංක 10 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අදාළ වගන්තිවල ක්‍රියාත්මක වන වෙනස් නිශ්චිත දින සඳහන් කර ඇත්නම් මිස, 2012 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2. 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) 2 වන සහ 3 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(i) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් හඳුනාගත් රජය විසින් බදු මුදල් ගෙවීම දරනු ලබන යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා භාවිත කිරීම පිණිස යම් භාණ්ඩයක් ආනයනය කිරීමේ දී එසේ ආනයනය කළ භාණ්ඩය සඳහා අයවිය යුතු බදු මුදල ආවරණය වන සමාගම් ඇපකරයක් සැපයීමට යටත්ව, ඒ ව්‍යාපෘතිය සම්පූර්ණ වීමෙන් පසුව ඒ භාණ්ඩය ප්‍රතිඅපනයනය කරන තෙක් වූ කාලය දක්වා 2009 ජූලි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි; හෝ

(ii) අවස්ථාවෝචිත පරිදි, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 16ඈ හෝ 17අ වගන්තිය යටතේ බද්දෙන් නිදහස් කිරීම සඳහා සුදුසුකම්ලත් යම් ව්‍යවසායයක් විසින්, බද්දෙන් නිදහස් කරන්නා වූ 1978 අංක 4 දරන ජාතික රාජ්‍ය සභාවේ ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතුළත් වූ ගිවිසුමේ

නිශ්චිතව දක්වා ඇති කාර්ය සඳහා එම ව්‍යවසායයේ භාවිතය පිණිස ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලසීමාව තුළ දී පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ වන යම් භාණ්ඩයක් ආනයනය කිරීමේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතුළත් වූ ගිවිසුමේ නිශ්චිතව සඳහන් කරන ලද කොන්දේසි සම්පූර්ණ කිරීමට සහ එසේ ආනයනය කළ භාණ්ඩ සඳහා අයවිය යුතු බදු මුදල ආවරණය වන බැංකු ඇපකරයක් සැපයීමට යටත්ව,

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බදු මුදල් එකතු කිරීම විලම්භනය කරනු ලැබිය යුතු ය.''.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු පනත (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ ''අවස්ථාවෝචිත පරිදි, I වන උපලේඛනයේ හෝ II වන උපලේඛනයේ'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''අවස්ථාවෝචිත පරිදි, I වන උපලේඛනයේ, II වන උපලේඛනයේ හෝ III වන උපලේඛනයේ'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන්:—

''(ඇ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු එහෙත් 2012 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන අවස්ථාවල දී;

(ඈ) 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන පනහක් නොඉක්මවන, අවස්ථාවල දී.''; සහ

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයේ ''ඒ අදාළ කාර්තුව සඳහා වූ මුළු පිරිවැටුම අදහස් වේ;'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

''ඒ අදාළ කාර්තුව සඳහා වූ මුළු පිරිවැටුම අදහස් වේ:

එසේ වුව ද, 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සම්බන්ධයෙන් වන, එම කාර්තුව අයත් වන තක්සේරු වර්ෂය ආරම්භ වීමට පෙරාතුව ම අවසන් වූ තක්සේරු වර්ෂය සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ තක්සේරු කරන ලද, යම් වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලැබෙන ලාභ සංයුක්ත වන බදු අය කළ හැකි ආදායමෙහි කොටස බිංදුවට වඩා වැඩි වන අවස්ථාවක දී, එම කාර්තුව සඳහා අදාළ පිරිවැටුම ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.'';

(ආ) (ආ) ඡේදයේ:—

(i) (අ) අනුඡේදයේ (viii) වන අයිතමයේ ''එකී හෝටලයේ ක්‍රියාකරුවාගේ හෝ නියෝජිතයාගේ ලැබීම්; සහ'' යන වචන වෙනුවට ''එකී හෝටලයේ ක්‍රියාකරුවාගේ හෝ නියෝජිතයාගේ ලැබීම්;'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) එම උපවගන්තියේ (ආ) ඡේදයේ (අ) අනුඡේදයේ (viii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

''(ix) මැටි උළු හෝ මැටි භාණ්ඩ නිෂ්පාදකයකු විසින්, ඒ මැටි උළු හෝ මැටි භාණ්ඩ විකිණීමෙන් උපචිත මුදල්; සහ''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:—

"II වන උපලේඛනය

(2 වන වගන්තිය)

2011 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 2012 මාර්තු 31 වන දිනයෙන් අවසන්වන කාලසීමාව සඳහා

| | | යටත්වන පිරිවැටුමේ කොටස | එම කොටසට අදාළ වන සේවා ගාස්තු අනුප්‍රමාණය |
|---|---|---|---|
| 1. | (අ) | ආයෝජන මණ්ඩල (BOI) ඇඟලුම් අපනයනකරුවන් | 0.1% |
| | (ආ) | ආයෝජන මණ්ඩල වෙළඳ නිවාස | |
| | (ඇ) | ආයෝජන මණ්ඩල ඇඟලුම් අපනයනකරුවන් සඳහා රෙදිපිළි නිෂ්පාදනය කරන නිෂ්පාදකයන් | |
| 2. | (අ) | ආදායම් බද්දෙන් නිදහස් ලාභ | 0.25% |
| | (ආ) | සහන අනුප්‍රමාණ මත බදු | |
| | (ඇ) | පාඩු | |
| | (ඈ) | (ESC පනතේ අර්ථනිරූපණය කර ඇති නිෂ්පාදකයන් සහ බෙදාහරින්නන් සහ මෝටර් වාහන, මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන වෙළඳුන් හැර) තොග හෝ සිල්ලර වෙළඳාමේ යෙදී සිටින තැනැත්තන් | |
| | (ඉ) | කපාපු පොල්, පොල් තෙල් සහ පොල් කෙඳි, කොප්පරා සහ ෂීට් රබර් ඇතුළුව (යම් මද්‍යසාරමය පාන වර්ග හැර) තේ, රබර් හෝ පොල් වගාවන් මූලික පරිවර්තනය කිරීම | |
| | (ඊ) | ප්‍රචාරක නියෝජිතයන් | |
| 3. | (අ) | මෝටර් වාහන, මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන වෙළෙඳුන් | 1%" |
| | (ආ) | ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයේ පිරිවැටුම් යන අර්ථ නිරූපණයට ගැනෙන ව්‍යාපාර ඇතුළුව වෙනත් යම් නිෂ්පාදන (බද්දට යටත් නොවන සීමාව නොතකා) | |

4. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ III වන උපලේඛනය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"III වන උපලේඛනය

(2 වන වගන්තිය)

2012 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලය සඳහා

| | |
|---|---|
| යටත්වන පිරිවැටුම මත | සියයට 0.25" |

5. මේ පනතේ 3 වන වගන්තිය මගින් ප්‍රතියෝජනය කරනු ලබන ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනයට මේ පනතේ සියලු කාර්ය සඳහා 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2012 අංක 12 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2012 මාර්තු මස 30 වන දින]

**2003 අංක 25 දරන මුදල් පනත, 2004 අංක 11 දරන මුදල් පනත සහ 1995 අංක 16 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස ද; ඇතැම් ක්‍රියාකාරකම්වල නිරතවන්නා වූ ඇතැම් ව්‍යවසායන් (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත යන පනත්වල විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කිරීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2012 අංක 12 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

2003 අංක 25 දරන මුදල් පනතේ II අ කොටස සංශෝධනය කිරීම

2. (මේ පනතේ මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 25 දරන මුදල් පනතේ II අ කොටසේ (තරු පහේ හෝටල්වල කාමර සඳහා බද්ද) 13 අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ගෙවීමට නියම කරනු ලැබිය යුතුය." යන වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"ගෙවීමට නියම කරනු ලැබිය යුතුය:

එසේ වුවද, ඉහත මිල පාලන නියෝගය යටතේ නිශ්චිතව දක්වා ඇති සහනදායී ගෙවීම් අනුප්‍රමාණ අදාළ වන්නා වූ ගුවන් සේවා කාර්ය මණ්ඩලයක යම් සාමාජිකයෙකුට සපයනු ලබන කාමර වෙනුවෙන් ඉහත සඳහන් කරනු ලැබූ යම් "තරු පහේ හෝටලයකට" එවැනි බද්දක් ගෙවීමට නියම කරනු නොලැබිය යුතු ය.".

3. 2011 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය දක්වා වූ කාල සීමාව තුළ යම් ගුවන් සේවා කාර්ය මණ්ඩලයක සාමාජිකයෙකුට සහනදායී ගෙවීම් අනුප්‍රමාණ යටතේ කාමර සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් හෝ ප්‍රධාන ප්‍රඥප්තියෙහි 13අ වන වගන්තියෙහි (3) වන උපවගන්තිය යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ මත ඒ සම්බන්ධයෙන් බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකු විසින් තරු පහේ හෝටල්වල කාමර සඳහා බද්ද අය කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සභාපතිවරයා හෝ තැනැත්තා නිසි බලය ඇතිව ක්‍රියාකර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බදු අය කිරීම වලංගු ආකාරයෙන් කරනු ලැබ ඇති හා කරන ලද ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. තවද, එකී බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු පැවරීම්වලින් ඒ සභාපතිවරයා හෝ තැනැත්තා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබේ.

II වන කොටස

2004 අංක 11 දරන මුදල් පනතේ III අ වන කොටස ඉවත් කිරීම

4. (මේ පනතේ මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2004 අංක 11 දරන මුදල් පනතේ III අ වන කොටස (මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ දී රැඳවුම් බද්දක් පැනවීම) 2011 නොවැම්බර් මස 24 වන දින සිට බල පැවැත්වෙන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ.

5. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ III අ වන කොටස ඉවත් කිරීම නොතකා, මෙහි (2) වන උපවගන්තියේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් එසේ ඉවත් කරනු ලැබූ III අ වන කොටස යටතේ අයවිය යුතු යම් මුදලක් අයකර ගැනීමට අවශ්‍ය වන්නා වූ කාල සීමාවක් සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන බල පැවැත්විය යුතුය.

(2) 2011 නොවැම්බර් මස 24 වන දින සිට බල පැවැත්වෙන පරිදි, ප්‍රධාන ප්‍රඥප්තියේ III අ වන කොටස ඉවත් කරනු ලැබුවද, එය නොතකා 2011 නොවැම්බර් මස 24 වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ දී අයවිය යුතු රැඳවුම් බද්ද ලෙස අය කරගනු ලැබිය යුතු සියලු මුදල් අයකර ගැනීමට සහ රැඳවුම් බද්ද ලෙස එසේ අය කරගනු ලැබූ සියලු මුදල් ඉවත් කරන ලද III අ වන කොටසේ 28 ඇ වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර කොමසාරිස් - ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට මෝටර් ප්‍රවාහන කොමසාරිස්වරයාට මෙයින් බලය පවරනු ලැබේ.

### III වන කොටස

1995 අංක 16 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම

6. (මේ පනතේ මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1995 අංක 16 දරන මුදල් පනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

3.(1) (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම සුඛෝපභෝගී මෝටර් වාහනයක් වෙනුවෙන් ම-

(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2011 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව අවසන් වන සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත;

(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ යම් වර්ෂයක බද්ද ගෙවිය යුතු දිනය, 2011 ජනවාරි මස 1 වන දිනයේ දී ආරම්භ වන සහ 2011 නොවැම්බර් මස 22 වන දිනයට පෙරාතුව ම අවසන් වන කාලසීමාව තුළ එළඹෙන අවස්ථාවක දී, මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත; සහ

(ඇ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ යම් වර්ෂයක බද්ද ගෙවිය යුතු දිනය, 2011 නොවැම්බර් මස 22 වන දිනයට පසුව එළඹෙන අවස්ථාවක දී, එම දිනයේ සිට අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා මේ පනතේ පළමුවන උපලේඛනයේ III වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත,

සුඛෝපභෝගී මෝටර් වාහන බද්දක් නියම කර, අයකළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේය. ඒ සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බද්ද සුඛෝපභෝගී මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු යː

එසේ වුවද, ඉහත (අ) ඡේදයේ සඳහන් කරනු ලැබූ අවුරුදු හතක කාල සීමාවෙන් කොටසක් 2011 ජනවාරි මස 1 වන දිනයට පසුව තවදුරටත් ඉතිරිව පවතින අවස්ථාවක දී, එම කාලය සඳහා අදාළ වන 2011 නොවැම්බර් මස 22 වැනි දින හෝ ඉන් පසුව ගෙවිය යුතු සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද මේ පනතේ පළමුවන උපලේඛනයේ III වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත ගෙවිය යුතු වන්නේ යː

එසේම තවදුරටත්, එම සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද-

(අ) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන්නා වූ යම් තැනැත්තකු හෝ යම් සංවිධානයක් විසින්; හෝ

(ආ) රජයේ හෝ යම් පළාත් සභාවක දෙපාර්තමේන්තුවක් හෝ අමාත්‍යාංශයක් විසින්,

අයිතිය දරන්නා වූ යම් සුඛෝපභෝගී මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී අය කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ.''.

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

4.(1) (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් වෙනුවෙන් ම -

(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව වූ වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන්පසුව ආරම්භ වන සහ 2011 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව අවසන් වන සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, මේ පනතේ දෙවන උපලේඛනයේ I වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත;

(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ යම් වර්ෂයක බද්ද ගෙවිය යුතු දිනය, 2011 ජනවාරි මස 1 වන දිනයේ දී ආරම්භ වන සහ 2011 නොවැම්බර් මස 22 වන දිනයට පෙරාතුව ම අවසන් වන කාලසීමාව තුළ එළඹෙන අවස්ථාවක දී, මේ පනතේ දෙවන උපලේඛනයේ II වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත; සහ

(ඇ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ යම් වර්ෂයක බද්ද ගෙවිය යුතු දිනය, 2011 නොවැම්බර් මස 22 වන දිනයට පසුව එළඹෙන අවස්ථාවක දී, එම දිනයේ සිට අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා මේ පනතේ දෙවන උපලේඛනයේ III වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත,

අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්දක් නියම කර, අයකළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බද්ද අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතුය:

එසේ වුවද, ඉහත (අ) ඡේදයේ සඳහන් කරනු ලැබූ අවුරුදු හතක කාල සීමාවෙන් කොටසක් 2011 ජනවාරි මස 1 වන දිනයට පසුව ඉතිරිව පවතින අවස්ථාවක දී, එම කාලය සඳහා අදාළ වන 2011 නොවැම්බර් මස 22 වන දින හෝ ඉන්පසුව ගෙවිය යුතු අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද මේ පනතේ දෙවන උපලේඛනයේ III වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත ගෙවිය යුතු වන්නේ ය:

එසේම තවදුරටත්, එම අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද-

(අ) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන්නා වූ යම් තැනැත්තකු හෝ යම් සංවිධානයක් විසින් ; හෝ

(ආ) රජයේ හෝ යම් පළාත් සභාවක දෙපාර්තමේන්තුවක් හෝ අමාත්‍යාංශයක් විසින්,

අයිතිය දරන්නා වූ යම් අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී අය කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ.".

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

5. (1) (වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් වෙනුවෙන් ම -

(අ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය 2011 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව අවසන් වන වර්ෂයක් වන අවස්ථාවක දී, 1995 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන් පසුව ආරම්භ වන සහ 2011 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ සෑම වර්ෂයක් සඳහා, එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා, මේ පනතේ තුන්වන උපලේඛනයේ I වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය

(ආ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ යම් වර්ෂයක බද්ද ගෙවිය යුතු දිනය, 2011 ජනවාරි මස 1 වන දිනයේ දී ආරම්භ වන සහ 2011 නොවැම්බර් මස 22 වන දිනයට පෙරාතුව අවසන් වන කාලසීමාව තුළ එළඹෙන අවස්ථාවක දී, මේ පනතේ තුන්වන උපලේඛනයේ II වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත; සහ

(ඇ) පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ යම් වර්ෂයක බද්ද ගෙවිය යුතු දිනය, 2011 නොවැම්බර් මස 22 වන දිනයට පසුව එළඹෙන අවස්ථාවක දී, එම දිනයේ සිට අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා මේ පනතේ තුන්වන උපලේඛනයේ III වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත,

අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්දක් නියම කර, අයකළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් සඳහා ම ගෙවිය යුතු බද්ද අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරු විසින් අදාළ දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු ය:

එසේ වුවද, ඉහත (අ) ඡේදයේ සඳහන් කරනු ලැබූ අවුරුදු හතක කාල සීමාවෙන් කොටසක් 2011 ජනවාරි මස 1 වන දිනයට පසුව තව දුරටත් ඉතිරිව පවතින අවස්ථාවක දී, එම කාලය සඳහා අදාළ වන 2011 නොවැම්බර් මස 22 වන දින හෝ ඉන් පසුව ගෙවිය යුතු අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද මේ පනතේ තුන්වන උපලේඛනයේ III වන කොටසේ පිළිවෙළින් දැක්වෙන ගෙවීම් ප්‍රමාණය මත ගෙවිය යුතු වන්නේ ය:

එසේම තවදුරටත්, එම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද-

(අ) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන්නා වූ යම් තැනැත්තකු හෝ යම් සංවිධානයක් විසින්; හෝ

(ආ) රජයේ හෝ යම් පළාත් සභාවකට අයත් දෙපාර්තමේන්තුවක් හෝ අමාත්‍යාංශයක් විසින්,

අයිතිය දරන්නා වූ යම් අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී අය කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 5 අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතු යː-

5 අ (1) පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින්-

(අ) මෙහි පළමුවන උපලේඛනයේ I වන කොටසේ, II වන කොටසේ සහ III වන කොටසේ දක්වා ඇති සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද;

(ආ) මෙහි දෙවන උපලේඛනයේ I වන කොටසේ, II වන කොටසේ සහ III වන කොටසේ දක්වා ඇති අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද;

(ඇ) මෙහි තුන්වන උපලේඛනයේ I වන කොටසේ, II වන කොටසේ සහ III වන කොටසේ දක්වා ඇති අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද,

වශයෙන් ගෙවනු ලබන ප්‍රමාණය වැඩි කිරීම හෝ අඩු කිරීම මගින් සංශෝධනය කරනු ලැබිය හැකිය.

(2) එම ගෙවීම් ප්‍රමාණ සංශෝධනය කිරීම සඳහා සම්මත කිරීමට අපේක්ෂිත යෝජනාවක් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූල ව පාර්ලිමේන්තුව මගින් අනුමත කරනු ලැබීමෙන් අනතුරුව, අදාළ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සංශෝධිත ගෙවීම් ප්‍රමාණ දක්වමින් ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කළ යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "එම පැහැර හැරි තැනැත්තා යටත් විය යුතු ය." යන වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේː-

"එම පැහැර හැරි තැනැත්තා යටත් විය යුතු යː

එසේ වුවද, එසේ ගෙවීම පැහැර හරිනු ලැබූ බද්ද අදාළ දිනයේ සිට දින හැටක කාලසීමාව ඉකුත් වීම හෝ බදු මුදල ගෙවනු ලැබිය යුතු වර්ෂයේ අවසානය යන දෙකෙන් කලින් එළඹෙන දිනයට පෙර නිශ්චිත මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් ගෙවනු ලැබුවහොත් එම දණ්ඩන මුදල එම ලියාපදිංචි අයිතිකරුගෙන් අය කරනු නොලැබිය යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේː-

(1) ඒ උපලේඛනයේ II වන කොටසේ ශීර්ෂය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කිරීමෙන්ː-

"පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ ගෙවීම් කළ යුතු දිනය 2011 ජනවාරි මස 1 වන දිනයේ දී ආරම්භ වන එහෙත් 2011 නොවැම්බර් මස 22 වන දිනයට පෙරාතුව අවසන් වන කාල සීමාව තුළ එළඹෙන යම් වර්ෂයක් සඳහාː- "

(2) ඒ උපලේඛනයේ II වන කොටසේ නිදර්ශනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නිදර්ශනය ආදේශ කිරීමෙන්ː-

**"නිදර්ශනය**

(අ) සුඛෝපභෝගී මෝටර් වාහනයක් 2007 අගෝස්තු මස 1 වන දින ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය වෙනුවෙන් (ලියාපදිංචි කළ වර්ෂයෙන් පසුව එළඹෙන තුන්වන වර්ෂය වන) 2010 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රුපියල් 35,000 ක් වේ.

(ආ) සුඛෝපභෝගී මෝටර් වාහනයක් 2011 අගෝස්තු මස 1 වන දින ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය වෙනුවෙන් (ලියාපදිංචි කළ වර්ෂය වන) එම වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රුපියල් 100,000 ක් වේ.

(ඇ) සුඛෝපභෝගී මෝටර් වාහනයක් 2012 අගෝස්තු මස 1 වන දින ලියාපදිංචි කර ඇත. ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය වෙනුවෙන් (ලියාපදිංචි කළ වර්ෂයෙන් පසුව එළඹෙන වර්ෂය වන) 2013 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය සඳහා ගෙවිය යුතු බද්ද රුපියල් 100,000 ක් වේ.".

(3) පළමුවන උපලේඛනයේ II වන කොටසේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්ː-

**"III වන කොටස**

මේ උපලේඛනයේ I වන කොටස සහ II වන කොටස අදාළ නොවන්නා වූ 2011 නොවැම්බර් මස 22 වන දින හෝ ඉන් පසුව අවසන් වන/ආරම්භ වන යම් වර්ෂයක් සඳහාː-

| | වර්ෂය | ගෙවීම් ප්‍රමාණය (රු.) |
|---|---|---|
| 1 | සුඛෝපභෝගී මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (2011 නොවැම්බර් මස 22 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | 150,000 |
| 2 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | 100,000 |
| 3 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවැනි වර්ෂය සඳහා | 75,000 |
| 4 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවැනි වර්ෂය සඳහා | 60,000 |
| 5 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වැනි වර්ෂය සඳහා | 50,000 |
| 6 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | 40,000 |
| 7 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | 30,000 |
| 8 | ඒ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | නැත". |

12. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ II වන කොටසේ ශීර්ෂය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කිරීමෙන්:-

"පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ ගෙවීම් කළ යුතු දිනය 2011 ජනවාරි මස 1 වන දින යේදී ආරම්භ වන එහෙත් 2011 නොවැම්බර් මස 22 වන දිනයට පෙරාතුව අවසන් වන කාල සීමාව තුළ එළඹෙන යම් වර්ෂයක් සඳහාඃ-"

(2) දෙවන උපලේඛනයේ II වන කොටසේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් ඃ-

**"III වන කොටස**

මේ උපලේඛනයේ I වන කොටස සහ II වන කොටස අදාළ නොවන්නා වූ 2011 නොවැම්බර් මස 22 වැනි දින හෝ ඉන් පසුව අවසන් වන/ආරම්භ වන යම් වර්ෂයක් සඳහා ඃ-

| | වර්ෂය | ගෙවීම් ප්‍රමාණය (රු.) |
|---|---|---|
| 1 | අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (2011 නොවැම්බර් මස 22 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | 60,000 |
| 2 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | 50,000 |
| 3 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවන වර්ෂය සඳහා | 40,000 |
| 4 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවන වර්ෂය සඳහා | 30,000 |
| 5 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වන වර්ෂය සඳහා | 25,000 |
| 6 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | 20,000 |
| 7 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | 15,000 |
| 8 | ඒ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | නැත". |

13. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ-

(1) ඒ උපලේඛනයේ II වන කොටසේ ශීර්ෂය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කිරීමෙන් ඃ-

"පළමුවෙන් ලියාපදිංචි කරනු ලබන වර්ෂය හෝ ගෙවීම් කළ යුතු දිනය 2011 ජනවාරි මස 1 වන දිනයේදී ආරම්භ වන එහෙත් 2011 නොවැම්බර් මස 22 වන දිනයට පෙරාතුව අවසන් වන කාල සීමාව තුළ එළඹෙන යම් වර්ෂයක් සඳහා ඃ-"

(2) තුන්වන උපලේඛනයේ II වන කොටසේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් ඃ-

## "III වන කොටස

මේ උපලේඛනයේ I වන කොටස සහ II වන කොටස අදාළ නොවෙන්නා වූ 2011 නොවැම්බර් මස 22 වන දින හෝ ඉන්පසුව අවසන් වන/ආරම්භ වන යම් වර්ෂයක් සඳහා :-

| | වර්ෂය | ගෙවීම් ප්‍රමාණය (රු.) |
|---|---|---|
| 1 | අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් ලියාපදිංචි කළ (2011 නොවැම්බර් මස 22 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන) වර්ෂය සඳහා | 40,000 |
| 2 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන ප්‍රථම වර්ෂය සඳහා | 25,000 |
| 3 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන දෙවන වර්ෂය සඳහා | 20,000 |
| 4 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන තෙවන වර්ෂය සඳහා | 12,000 |
| 5 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන සිව්වන වර්ෂය සඳහා | 10,000 |
| 6 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන පස්වන වර්ෂය සඳහා | 8,000 |
| 7 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හයවන වර්ෂය සඳහා | 6,000 |
| 8 | ඒ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය ලියාපදිංචි කළ වර්ෂයට පසුව එළඹෙන හත්වන වර්ෂය සඳහා | නැත". |

14. මේ පනතේ මේ කොටස මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2011 නොවැම්බර් මස 22 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

15. 2011 නොවැම්බර් මස 22 වන දිනයෙන් ආරම්භ වී, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනය දක්වා වූ කාලය තුළ යම් තැනැත්තෙකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, මේ පනතේ මේ කොටසේ විධිවිධාන සලස්වා තිබෙන පරිදි බදු එකතු කරගන්නේ ද, ඒ තැනැත්තා නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කර ගැනීම වලංගු ආකාරයෙන් කරනු ලැබ ඇති හා කරන ලද ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. තවද එසේ බදු එකතු කිරීම හා සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩු පැවරීම්වලින් ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබේ.

## IV වන කොටස

(235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත යන පනත්වල විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කිරීම

16. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතිකර ගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන යම් ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වන්නේ ය :-

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළඳාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර ;

(ඇ) විදේශීය සේවාදායකයන්ට පෙර නිමි සේවා සැපයීම;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංග්‍රහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන නිදහස් වරායක දී හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ හෝ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ ප්‍රකාශයට පත්කරන ලද බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකිය;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාචෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතුය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදුකරනු ලැබිය හැකි ය.

17. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන යම් ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වන්නේ යඃ-

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළදාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්හට පෙර නිමි සේවා සැපයීම;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායයක්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන නිදහස් වරායක දී හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ හෝ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකිය;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාචෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතුය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදුකරනු ලැබිය හැකිය.

18. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන යම් ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වන්නේ යඃ-

(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළෙඳාම;

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්ට පෙර නිමි සේවා සැපයීම;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම.

(2) ප්‍රතිඅපනයනය කිරීම සඳහා භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ ආනයනය කිරීමෙහි නිරතව සිටින (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන නිදහස් වරායක දී හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ හෝ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද බන්ධිත ප්‍රදේශයක දී එම කටයුතුවල නිරත විය හැකිය;

(ආ) එවැනි නිදහස් වරායක සිට හෝ එවැන්නක් දක්වා හෝ බන්ධිත ප්‍රදේශයක සිට හෝ එවැන්නක් දක්වා ශ්‍රී ලංකා භූමියෙන් භාණ්ඩ සංචලනය කිරීමේ දී, (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ ලෙස සලකා රේගු ආඥාපනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

(3) භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදුකරනු ලැබිය හැකිය.

19. 16 වන, 17 වන සහ 18 වන වගන්ති ප්‍රකාරව නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලැබ ඇති ව්‍යවසායන් විසින්,-

(අ) විදේශ විනිමය අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණය සහ වෙනත් ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ලිපි ලේඛන පවත්වාගෙන යාමට වගබලා ගැනීම;

(ආ) වාර්ෂිකව හෝ අවස්ථාවෝචිත පරිදි රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ විනිමය පාලකවරයා විසින් හෝ ආනයන සහ අපනයන පාලකවරයා විසින් විධානය කරනු ලබන අවස්ථාවක දී, විදේශ විනිමය අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කිරීම; සහ

(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා විමසා විනිමය පාලකවරයා විසින් සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් සියලු තොරතුරු එවැනි වාර්තාවකට ඇතුළත් කිරීම,

සිදුකරනු ලැබිය යුතුය.

20. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.